# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන සාමාන්‍ය මිල මට්ටම, 2017 වසරේ දී, සමස්තයක් ලෙස මිශ්‍ර විචලන සහිතව ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කරමින් සාපේක්ෂව ඉහළ මට්ටම්වල පැවතුණි. මේ සඳහා ආර්ථිකයේ සැපයුම් අංශයේ සිදු වූ අවහිරතා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2016 වසරේ අග භාගයේ සිට 2017 වසරේ ද බොහෝ කාලයක් මුළුල්ලේ දිවයිනේ ප්‍රදේශ රැසක පැවති දිගු කාලීන නියං තත්ත්වය, සියලු පාරිභෝගික මිල දර්ශකවල සාපේක්ෂව වැඩි කොටසක් නියෝජනය කරන දේශීයව නිෂ්පාදනය කෙරෙන ප්‍රධාන ආහාර අයිතම මත අහිතකර බලපෑමක් ඇති කළ අතර එමගින් එම ආහාර අයිතමවල මිල මත ඉහළ පීඩනයක් එල්ල විය. කෙසේ වුවද, සමහර ආනයනික ආහාර අයිතමවලට අදාළ ආනයනික බදු පහත දැමීම මගින්, මෙම අහිතකර බලපෑම තරමක් දුරට සමනය විය. ඇතැම් අයිතමවල පරිපාලිත මිල ගණන් ඉහළ දැමීම හේතු කොට ගෙන ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ඉහළ ගිය මිල ගණන් ද, සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යන නැඹුරුවට දායක විය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය සමස්තයක් වශයෙන් 2017 වසර තුළ දී ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තවදුරටත්, සමස්ත නිෂ්පාදක මිල ගණන්, 2017 වසර තුළ දී ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කරන ලද අතර ඒ සඳහා, කෘෂිකර්මාන්ත හා නිෂ්පාදන යන දෙඅංශයෙහිම නිෂ්පාදක මිල ගණන්වල සිදු වූ ඉහළ යෑම හේතු විය. මූර්ත වැටුප් ප්‍රවණතා සලකා බැලූ කළ, ඇතැම් අංශවල පැවැති ශ්‍රම හිඟය යම්තාක් දුරට හේතුකොට ගෙන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්වල පමණක් වර්ධනයක් සිදු වූ අතර, 2017 වසර තුළ දී විධිමත් අංශයේ මූර්ත වැටුප්වල පහළ යෑමක් දක්නට ලැබිණි. ආර්ථිකය තුළ ඉහළ ගිය රැකියා අවස්ථා පෙන්නුම් කරමින්, විදේශ රැකියා අවස්ථාවල සිදු වූ අඩු වීම මධ්‍යයේ වුවද, සමස්ත සේවා වියුක්ති අනුපාතිකය පසුගිය වසරට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවද, නිපුණතා පරතරය හේතුවෙන් ආර්ථිකයේ බොහෝ නැගී එන අංශ ආශ්‍රිතව ශ්‍රම හිඟයක් පැවතිය ද තරුණ, කාන්තා සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් අතර සේවා වියුක්තිය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. දේශීය වෙළඳපොළ තුළ පවතින ශ්‍රම හිඟයට විසඳුම් සෙවීමේ දී පෞද්ගලික අංශයේ ද සහය ඇතිව, ආධුනිකත්ව පුහුණු ආයතන මගින් ශ්‍රම ඉල්ලුමට සරිලන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ, කම්කරු නීති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම වැදගත් වනු ඇත. මෙය විශේෂයෙන්ම ග්‍රාමීයව වෙසෙන හැකියා සහිත ශ්‍රමිකයන් ආකර්ෂණය කරගැනීම සඳහා ද උපකාරී වනු ඇත.

## 4.2 මිල

### පොදු මිල මට්ටමේ විචලන

**පාරිභෝගික මිල දර්ශක මගින් පදනම් කාලපරිච්ඡේදයකට සාපේක්ෂව සාමාන්‍ය ගෘහ ඒකකයක් විසින් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා සහිත භාණ්ඩ පැසක සමස්ත මිල මට්ටම මනිනු ලබයි.** නිල පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීමේ වගකීම පැවරී ඇති ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) යන දර්ශක

ද්විත්වය ගණනය කරයි. ජා.පා.මි. දර්ශකයෙහි විචලන මගින් ජාතික මට්ටමින් තෝරා ගත් පාරිභෝගික අයිතමවල මිල ප්‍රවණතා සහ පාරිභෝගිකයන්ගේ පරිභෝජන සහ වියදම් රටා පෙන්නුම් කරන අතර, කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයන්ගේ, පරිභෝජන සහ වියදම් සහ පාරිභෝගික අයිතමවල මිල ප්‍රවණතා පෙන්නුම් කරයි. කො.පා.මි.ද. හා සැසඳීමේ දී ජා.පා.මි. දර්ශකයෙහි ආහාර සඳහා කරන වියදම් සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර කොළඹ දිස්ත්‍රික්කයෙහි කුටුම්භ ඒකක මගින් ඔවුන්ගේ වියදමින් වැඩි කොටසක් ආහාර නොවන කාණ්ඩය සඳහා වෙන් කරන බවත් සමස්ත රට නියෝජනය කරන සාමාන්‍ය ගෘහ ඒකකයක වියදමින් වැඩි කොටසක් ආහාර සඳහා වැය කරන බවත් ඉන් පෙන්නුම් කෙරේ. මෙම දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2017 වසර තුළ දී, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල වැඩි වීම හේතු කොට ගෙන මිශ්‍ර විචලන සහිතව ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළේය.



**පෙර වසරවල දී මෙන්ම ආහාර කාණ්ඩයේ මිල විචලනය, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල[1] මිල විචලනයට අනුරූප විය.** දීර්ඝ කාලයක් පුරා පැවති අහිතකර දේශගුණික තත්ත්ව නිසා ඇති වූ සැපයුම් අංශයේ බාධා හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාරවලට අයත් අයිතමවල මිල ගණන්, විශේෂයෙන්ම සහල් සහ පොල්, 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ දී, සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සැපයුම් අංශයේ බාධක හේතුවෙන් පාරිභෝගික මිල ගණන් මත ඇතිවිය හැකි අහිතකර බලපෑම අවම කිරීම සඳහා රජය සහල් ආනයනය දිරිමත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, එවකට ආනයනික සහල් මත පැවති බදු ව්‍යුහය ඉවත් කර, 2017 ජනවාරි මස 07 වන දින සිට බල පැවැත්වෙන පරිදි, ආනයනික සහල් වර්ග සඳහා කිලෝ ග්‍රෑම් 1 කට රුපියල් 15 බැගින් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පමණක් පනවන ලදී. මෙම විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවස්ථා කිහිපයකදී අඩු කළ අතර 2017 ජූලි මස 27 දින සිට එය කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා ශත 25 ක් විය. ඉහළ යමින් පැවති සිල්ලර මිල ගණන් පාලනය කිරීම සඳහා සහල් වර්ග කිහිපයක් මත, උපරිම සිල්ලර මිලක් පනවන ලදී. දිගු කාලයක් පුරා පැවති නියං තත්ත්වයෙහි පසුකාලීන බලපෑම හේතුවෙන් නිෂ්පාදනය අඩු වීම නිසා 2017 වසරේ දෙවැනි භාගය තුළ දී පොල් මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර එය පාලනය කිරීම සඳහා, 2017 දෙසැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පොල් ගෙඩියකට රුපියල් 75 ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. ඒ අනුව 2017 වසරේ දෙවන භාගය තුළ දී ඉහළ මට්ටමක පැවතුණ පොල් මිල, වසර අවසානය වන විට ක්‍රමයෙන් අඩු විය. එමෙන්ම, පොල් මද ආනයනය සඳහා පැවති බදු ව්‍යුහය ඉවත් කොට,

1 නිතර මිල උච්චාවචන සහිත අයිතම කාණ්ඩය තුළ සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුලත් වේ.

**4.1 සංඛ්‍යා සටහන**

**දේශීයව නිෂ්පාදිත සහ ආනයනික ප්‍රධාන අයිතමවල සිල්ලර මිල ගණන්**

| අයිතමය | | | ඒකකය | වාර්ෂික සාමාන්‍යය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මිල - රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
| | | | | 2015 | 2016 | 2017 | 2016/ 2015 | 2017/ 2016 |
| දේශීය | සහල් | - සම්බා | කි.ග්‍රෑ. 1ක් | 91.20 | 92.75 | 98.79 | 1.7 | 6.5 |
| | | රතු කැකුළු | කි.ග්‍රෑ. 1ක් | 76.57 | 69.52 | 87.94 | -9.2 | 26.5 |
| | | සුදු කැකුළු | කි.ග්‍රෑ. 1ක් | 69.30 | 72.12 | 83.64 | 4.1 | 16.0 |
| | | නාඩු | කි.ග්‍රෑ. 1ක් | 77.95 | 78.71 | 94.37 | 1.0 | 19.9 |
| | උඩරට එළවළු | - බෝංචි | කි.ග්‍රෑ. 1ක් | 209.53 | 204.75 | 192.36 | -2.3 | -6.1 |
| | | කැරට් | කි.ග්‍රෑ. 1ක් | 199.88 | 188.86 | 193.98 | -5.5 | 2.7 |
| | | ගෝවා | කි.ග්‍රෑ. 1ක් | 143.67 | 154.71 | 155.38 | 7.7 | 0.4 |
| | | බීට්රූට් | කි.ග්‍රෑ. 1ක් | 160.12 | 165.81 | 163.14 | 3.6 | -1.6 |
| | පහතරට එළවළු | - වම්බටු | කි.ග්‍රෑ. 1ක් | 123.87 | 133.08 | 161.72 | 7.4 | 21.5 |
| | | බණ්ඩක්කා | කි.ග්‍රෑ. 1ක් | 138.80 | 139.29 | 148.89 | 0.4 | 6.9 |
| | | වැටකොළු | කි.ග්‍රෑ. 1ක් | 149.56 | 155.58 | 192.23 | 4.0 | 23.6 |
| | | කරවිල | කි.ග්‍රෑ. 1ක් | 185.35 | 200.51 | 236.98 | 8.2 | 18.2 |
| | පොල් (මධ්‍යම ප්‍රමාණය) | | ගෙඩියක් | 50.49 | 46.12 | 67.67 | -8.6 | 46.7 |
| | මාළු (කෙළවල්ලා) | | කි.ග්‍රෑ. 1ක් | 799.29 | 860.68 | 950.17 | 7.7 | 10.4 |
| | බිත්තර | | එකක් | 14.80 | 16.10 | 14.08 | 8.7 | -12.5 |
| ආනයනික | සීනි | | කි.ග්‍රෑ. 1ක් | 87.80 | 100.69 | 107.48 | 14.7 | 6.7 |
| | රතු පරිප්පු | | කි.ග්‍රෑ. 1ක් | 184.07 | 191.16 | 180.52 | 3.9 | -5.6 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.2 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල සහිත ප්‍රධාන අයිතම**

| අයිතමය | ඒකකය | මිල (වසර අග) - රුපියල් | | | ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2016 | 2017 | 2015/2014 | 2016/2015 | 2017/2016 |
| භූමිතෙල් | ලී. 1ක් | 59.00 | 49.00 | 44.00 | -39.5 | -16.9 | -10.2 |
| ගෑස් - ලිට්‍රෝ | කි.ග්‍රෑ. 12.5 | 1,346.00 | 1,321.00 | 1,431.00 | -29.0 | -1.9 | 8.3 |
| ගෑස් - ලාෆ් | කි.ග්‍රෑ. 12.5 | 1,346.00 | 1,321.00 | 1,431.00 | -29.0 | -1.9 | 8.3 |
| බස් ගාස්තු | | | | | -8.2 | 6.0 | 6.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2017 දෙසැම්බර් 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, කිලෝ ග්‍රෑම් 1 කට රුපියලක් බැගින් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවන ලදී. 2017 වසරේ මැයි මස පැවති අහිතකර කාලගුණික තත්ත්ව සමග ධීවර කටයුතු සීමිත වීම හේතුවෙන් ඇති වූ අඩු සැපයුම් තත්ත්වය නිසා, වසර මැද දක්වාම නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, ඉන් අනතුරුව මිල ගණන් පහළ වැටුණි. සාමාන්‍යය ඍතුමය රටාව අනුව යමින් එළවළුවල බර තබන ලද සාමාන්‍යය මිල ද, 2017 වසර තුළ දී පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. අර්තාපල් මිල ගණන් සමස්තයක් ලෙස මිශ්‍ර විචලන සහිතව පහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර ලොකු ළූණු සහ රතු ළූණු මිල ගණන් 2017 වසරේ දී සමස්තයක් ලෙස ඉහළ ගියේය.

**ආහාර කාණ්ඩය තුළ, නිතර මිල උච්චාවචන සහිත ආහාර හැරුණු කොට අනෙකුත් ආහාර අයිතමවල මිල ගණන්, 2017 වසර තුළ දී මධ්‍යස්ථ වේගයකින් ඉහළ ගියේය.** ප්‍රධාන ආනයනික ආහාර අයිතමවල දේශීය වෙළඳපොළ මිල ගණන් 2017 වසරේ දී, පෙර වසරට සාපේක්ෂව සුළු වැඩි වීමක් පෙන්නුම් කළේය. 2017 වසරේ දී දේශීය වෙළඳපොළ තුළ සීනි මිල පෙර වසර හා සැසඳීමේ දී ඉහළ ගිය අතර, මේ සඳහා දේශීය සීනි නිෂ්පාදනය දිරිමත් කිරීමේ අරමුණින් වසර තුළ දී අවස්ථා කිහිපයකදී ආනයනික සීනි සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දැමීම තරමක් දුරට හේතු විය. මේ අතර, වසර ආරම්භයේ දී ඉහළ මට්ටමක පැවතුණු පරිප්පු මිල ක්‍රමයෙන් අඩු වී පෙර වසරේ පැවති මිල ගණන්වලට වඩා අඩු මිලක් වාර්තා කළේය. දේශීය වෙළඳපොළ තුළ ඉහළ යන මිල ගණන් මගින් ඇති කළ මිල පීඩනය අවම කර ගැනීම සඳහා 2017 ජනවාරි මාසයේ දී සීනි, වියළි හාල්මැස්සන්, පරිප්පු සහ අර්තාපල් ඇතුළු සමහර ආහාර අයිතම සඳහා උපරිම සිල්ලර මිලක් පනවන ලදී.

**පොදු මිල මට්ටම කෙරෙහි යම් තරමකට ඉහළ පීඩනයක් ඇති කරමින්, ආහාර නොවන සහ අනෙකුත් කාණ්ඩවල මිල ගණන්වල සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ නැඹුරුවක් දක්නට ලැබිණි.** ආහාර නොවන කාණ්ඩයෙහි මිල ගණන්වල සිදු වූ මෙම වැඩි වීම සඳහා තෝරා ගත් ආහාර නොවන අයිතමවල සිදු කළ පරිපාලිත මිල සංශෝධන දායක විය. පරිපාලිත මිල සංශෝධන මගින් එල්.පී. ගෑස් මිල සහ බස් ගාස්තු ඉහළ දමන ලද අතර, භූමිතෙල් මිල පහළ දමන ලදී. ඒ අනුව, 2017 ඔක්තෝබර් මාසය තුළ දී ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයෙහි, පිසින ලද ආහාරවල මිල ගණන්වල සිදු වූ වැඩි වීමට, 2017 සැප්තැම්බර් මාසයේ දී එල්.පී. ගෑස් මිලෙහි සිදු වූ ඉහළ යෑම හේතු වන්නට ඇත. 2017 වසර තුළ දී, ලොතරැයි ටිකට් පතක මිල රුපියල් 20 සිට රුපියල් 30 දක්වා ඉහළ දැමීමත්, ඉන් අනතුරුව එය නැවත රුපියල් 20 දක්වා අඩු කිරීමත් දක්නට ලැබිණි. අන්තර්ජාල සේවා සඳහා වන සන්නිවේදන බදු ඉවත් කිරීමත් සමග අන්තර්ජාල ගාස්තුවල සුළු අඩුවීමක් දක්නට ලැබිණි. 2018 අය වැය අනුව මධ්‍යසාර සඳහා පරිමාව මත පදනම් වූ සුරාබදු හඳුන්වා දීමත් සමග අරක්කු මිලෙහි ඉහළ යෑමක් සහ බීර මිලෙහි පහළ යෑමක් 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී දක්නට ලැබිණි. ඩෙංගු උණ රෝගය සඳහා රෝග විනිශ්චය කිරීමට පෞද්ගලික අංශයේ රෝහල්වල සිදු කරන රුධිර පරීක්ෂණ සඳහා වූ වෛද්‍ය ගාස්තු අඩු කිරීමට රජය සිදු කළ මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 ජූනි සහ ජූලි මාසවල දී වෛද්‍ය පරීක්ෂණ ගාස්තුවල පහළ යෑමක් ද, ඩෙංගු වසංගත තත්ත්වය පහළ යෑමත් සමග එම ගාස්තුවල නැවත වැඩි වීමක් ද නිරීක්ෂණය කළ හැකි විය.

## පාරිභෝගික මිල දර්ශක

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

**ජා.පා.මි.ද. 2017 ජනවාරි මාසයේ දී දර්ශක අංක 119.3 ක් වූ අතර, එය 2017 දෙසැම්බර් මාසය වන විට දර්ශක අංක 126.6 දක්වා ඉහළ ගියේය.** මාසික පදනම මත, 2017 වසරේ පළමු මාස දෙක තුළ දී ජා.පා.මි.ද. ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, එය මාර්තු මාසයේ දී සුළු වශයෙන් පහළ ගියේය. ඉන් අනතුරුව 2017 ජූනි මාසය දක්වා එම දර්ශකයෙහි ඉහළ යෑමක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවත්, 2017 ජූලි සහ අගෝස්තු මාසවල දී ජා.පා.මි.ද. පහළ යෑමක් වාර්තා කළ අතර, ඉන් අනතුරුව වසර අවසානය දක්වා එය

**4.3 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකය (වසර අග) | | වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 (අ) | 2016 දෙසැ/ 2015 දෙසැ | 2017 දෙසැ/ 2016 දෙසැ (අ) | 2016/2015 | 2016/2017 (අ) |
| ජා.පා.මි.ද. (2013=100) | 118.0 | 126.6 | 4.2 | 7.3 | 4.0 | 7.7 |
| කො.පා.මි.ද. (2013=100) | 114.7 | 122.9 | 4.5 | 7.1 | 4.0 | 6.6 |
| නි.මි.ද. (2013-4 වැනි කාර්තුව=100) | 115.3 (ආ) | 131.8 | 7.5 (ආ) | 14.3 | 1.7 (ආ) | 17.0 |
| ද.දේ.නි. අවධමනකය (2010=100) | 131.8 (ආ) | 142.7 | - | - | 4.1 (ආ) | 8.2 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහළ ගියේය. 2017 වසර තුළ දී, ජා.පා.මි. දර්ශකයෙහි විචලනය, ප්‍රධාන වශයෙන් ආහාර කාණ්ඩයේ මිල විචලනය හේතුවෙන් සිදු වූ අතර ඇතැම් මාසවල දී පමණක් ආහාර නොවන කාණ්ඩයේ ද සැලකිය යුතු දායකත්වයක් දක්නට ලැබිණි.

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

**2017 ජනවාරි මාසයේ දී දර්ශක අංක 116.1 ලෙස පැවති කො.පා.මි.ද. 2017 දෙසැම්බර් මාසයේ දී දර්ශක අංක 122.9 දක්වා ඉහළ ගියේය.** වෙනස් පරිමාණවලින් වුවද කො.පා.මි. දර්ශකයෙහි විචලනය ජා.පා.මි. දර්ශකයෙහි විචලනයට අනුරූප විය. 2017 වසරේ දී කො.පා.මි. දර්ශකයෙහි විචලනය ආහාර කාණ්ඩයේ මිල විචලනයට අනුරූප වූ අතර, ජනවාරි සහ නොවැම්බර් මාස දෙකෙහි දී පමණක් එහි විචලනය ආහාර නොවන කාණ්ඩය අනුව සිදු විය. 2017 වසර තුළ දී, කො.පා.මි.ද. සඳහා ආහාර නොවන කාණ්ඩයේ සැලකිය යුතු දායකත්වයක් දක්නට ලැබුණු අතර, සන්සන්දනාත්මකව ජා.පා.මි.ද. සඳහා එහි දායකත්වය අඩු මට්ටමක පැවතුණි. කො.පා.මි. දර්ශකයෙහි ආහාර නොවන කාණ්ඩයේ බර තැබීම ජා.පා.මි.ද. ට සාපේක්ෂව ඉහළ අගයක් ගැනීම මෙයට හේතු වන්නට ඇත.

### මතුපිට උද්ධමනය

**2017 වසර තුළ දී, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලැබූ මතුපිට උද්ධමනය මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2017 වසරේ පළමු කාර්තුව තුළ දී, ජනවාරි මස වාර්තා කළ සියයට 6.5 සිට මාර්තු මාසයේ දී සියයට 8.6 ක් දක්වා ඉහළ ගිය අතර, 2017 දෙවන කාර්තුව තුළ දී ක්‍රමයෙන් පහළ ගියේය. කෙසේ වුවද, 2017 වසරේ තුන්වන කාර්තුව තුළ දී මෙය නැවතත් ඉහළ ගිය අතර ඔක්තෝබර් මාසයේ දී සියයට 8.8 ක ඉහළම අගයක් වාර්තා කොට දෙසැම්බර් මාසයේ දී සියයට 7.3 ක් දක්වා නැවත පහළ ගියේය. 2017 වසරේ දී පෙන්නුම් කළ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමන විචලන සඳහා ප්‍රධාන වශයෙන්ම 2016 වසර තුළ දී ආහාරවල මිලෙහි සිදු වූ වෙනස්කම් මෙන්ම 2016 වසර තුළ දී හඳුන්වා දුන්, අත්හිට වූ සහ යළි පැනවූ රාජ්‍ය බදු සංශෝධන මගින් ඇති වූ පදනම් බලපෑම හේතුවිය. තවදුරටත්, 2017 වසරේ ජනවාරි, පෙබරවාරි, සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාසවල දී ආහාර මිලෙහි ඉහළ යෑම නිසා ඇති වූ මාසික වැඩි වීම, මෙම මාසවල වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි ඉහළ යෑමට දායක විය. මේ අතර, ජ.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යය උද්ධමනය 2017 ජනවාරි මස වාර්තා කළ සියයට 4.6 සිට දෙසැම්බර් මාසය වන විට සියයට 7.7 ක අගය දක්වා ක්‍රමයෙන් ඉහළ ගියේය.

**කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද ජා.පා.මි. දර්ශකයෙහි උද්ධමනය පෙන්නුම් කළ නැඹුරුවට සමාන විචලනයක් අනුගමනය කළේය.** ඒ අනුව, කො.පා.මි. දර්ශකයෙහි උද්ධමනය

**4.1 රූප සටහන**

**උද්ධමනයේ විචලන (ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද.)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.4 සංඛ්‍යා සටහන**

**උප කාණ්ඩ අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සඳහා දායකත්වය - 2017 දෙසැම්බර්**

| දර්ශකය | කො.පා.මි.ද (2013=100) ප්‍රතිශත | | ජා.පා.මි.ද (2013=100) ප්‍රතිශත | |
|---|---|---|---|---|
| | වෙනස | දායකත්වය | වෙනස | දායකත්වය |
| **සියලුම අයිතම** | **7.1** | **100.0** | **7.3** | **100.0** |
| **ආහාර හා මද්‍යසාර නොවන පාන වර්ග** | **14.4** | **59.2** | **12.8** | **77.6** |
| **ආහාර නොවන, මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ** | **4.2** | **40.8** | **2.9** | **22.4** |
| මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ | 1.5 | 0.3 | -0.9 | -0.4 |
| රෙදිපිළි හා පාවහන් | 6.0 | 2.0 | 2.9 | 1.3 |
| නිවාස, ජලය, විදුලි, ගෑස් හා වෙනත් ඉන්ධන | 0.3 | 1.4 | 0.7 | 1.7 |
| ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තුව | 13.7 | 4.6 | 5.1 | 2.2 |
| සෞඛ්‍ය | 6.5 | 5.1 | 3.4 | 2.3 |
| ප්‍රවාහන | 4.0 | 4.9 | 5.2 | 6.0 |
| සන්නිවේදන | -0.7 | -0.3 | -0.2 | -0.1 |
| විනෝදාත්මක හා සංස්කෘතික | 2.6 | 0.4 | 2.6 | 0.5 |
| අධ්‍යාපන | 11.0 | 9.3 | 4.4 | 1.7 |
| ආපනශාලා සහ හෝටල් | 9.1 | 6.5 | 2.3 | 1.2 |
| විවිධ භාණ්ඩ හා සේවා | 13.2 | 6.5 | 9.6 | 6.0 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 ජනවාරි මස සියයට 5.5 ක අගයක් වාර්තා කොට, ඔක්තෝබර් මාසයේ දී සියයට 7.8 ක ඉහළම අගයකට ළඟා වී, දෙසැම්බර් මාසයේ දී සියයට 7.1 ක් දක්වා පහත වැටුණි. කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි විචලන, පදනම් බලපෑම සහ කො.පා.මි දර්ශකයෙහි අයිතමවල මාසික විචලන අනුව සිදු විය. කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යය උද්ධමනය 2017 ජනවාරි මස වාර්තා කළ සියයට 4.3 සිට 2017 දෙසැම්බර් මාසයේ දී වාර්තා කළ සියයට 6.6 දක්වා ඉහළ ගියේය.

**4.2 රූප සටහන**

**මූලික උද්ධමනයෙහි විචලන**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## මූලික උද්ධමනය

ජා.පා.මි.ද. පදනම්වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යන ප්‍රවණතාවක් දැක්වීය. 2017 වසරේ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ පහළ යන ප්‍රවණතාවයට, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිලෙහි වූ මධ්‍යස්ථ ප්‍රමාණයේ ඉහළ යෑම සමඟ 2016 වසර තුළ දී රජයේ බදු සඳහා හඳුන්වා දුන් සංශෝධන හේතුවෙන් ඇතිවූ පදනම් බලපෑම දායක විය. ඒ අනුව, ජා.පා.මි.ද. පදනම් කරගත් මූලික උද්ධමනය 2017 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 7.1 සිට 2017 දෙසැම්බර් මාසයේ දී සියයට 2.7 දක්වා පහළ යන ලදී. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය මීට සමාන ප්‍රවණතාවයක් දක්වමින්, 2017 ජනවාරි මස දී සියයට 7.0 සිට 2017 මාර්තු මාසයේ දී සියයට 7.3 ක් දක්වා ඉහළ ගොස් 2017 දෙසැම්බර් මස දී සියයට 4.3 දක්වා අඩුවිය.

## නිෂ්පාදක මිල උද්ධමනය

දේශීය නිෂ්පාදකයන් විසින් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සඳහා ලබන සාමාන්‍යය මිල ගණන්වල විචලන මැනීම සඳහා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරන නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද., 2013 සිව්වන කාර්තුව=100) 2017 වසර තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. නි.මි.ද. මගින් ආර්ථිකයෙහි කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගිතා (විදුලිය හා ජල සැපයුම) යන අංශවල

නිෂ්පාදක මිල ගණන් ආවරණය කරයි. කෘෂිකර්මාන්ත සහ නිෂ්පාදන යන අංශ දෙකෙහිම නිෂ්පාදක මිල ගණන් වසර තුළ දී ඉහළ ගියේය. මේ අතර, පළමු සහ සිව්වන කාර්තුවල දී විදුලිය සහ ජල සැපයුම් අංශයෙහි නිෂ්පාදක මිල ස්ථාවර මට්ටමක පැවතුනද, දෙවන සහ තුන්වන කාර්තුවල දී උච්චාවචනය වන ස්වභාවයක් පෙන්නුම් කළේය. වසර තුළ දී කෘෂිකර්මාන්ත අංශයේ නිෂ්පාදක මිලෙහි පෙන්නුම් කළ තීව්‍ර ඉහළ යෑමට දීර්ඝ කාලීනව පැවති අහිතකර කාලගුණික තත්ත්වය හේතු විය. මෙය පාරිභෝගික ආහාර අයිතමවල මිල ගණන්වලින් ද පිළිබිඹු විය.

2017 වසරේ දී නි.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය සමස්තයක් වශයෙන් ස්ථාවරව පැවතුණි. කෘෂිකර්මාන්ත උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය, වසර තුළ දී සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුතාවක් පෙන්නුම් කළේය. වසර තුළ දී විදුලිය සහ ජල සැපයුම් උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය සියයට -1.8 සහ සියයට 2.8 අතර වෙනස් විය. මේ අතර, නිෂ්පාදන උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය, 2017 වසර තුළ දී පහළ යන ප්‍රවණතාවක් පෙන්වීය. සමස්ත නිෂ්පාදක මිල උද්ධමනය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්ත උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය අනුගමනය කළ අතර, එම කාලපරිච්ඡේදය තුළ පාරිභෝගික මිල උද්ධමනය ද මෙම ප්‍රවණතාව පෙන්නුම් කළේය. කෙසේ වුවත්, නි.මි. දර්ශකයෙහි ඉහළම බර තැබීමක් ඇති නිෂ්පාදන උප අංශයේ මිල ගණන්වල පහළ යන ප්‍රවණතාවය, සමස්ත නිෂ්පාදක මිල උද්ධමනයේ ඉහළ යෑම ලිහිල් කිරීමට දායක විය.

4

**4.3 රූප සටහන**

**නිෂ්පාදක මිල උද්ධමනයෙහි විචලන**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.5 සංඛ්‍යා සටහන**

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

(2010=100)

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2015 (අ) | 2016 (අ) | 2017 (ආ) | 2016/2015 (අ) | 2017/2016 (ආ) |
| කෘෂිකර්මාන්ත | 133.8 | 138.2 | 160.2 | 3.3 | 15.9 |
| කර්මාන්ත | 131.2 | 135.4 | 145.0 | 3.2 | 7.1 |
| සේවා | 128.4 | 132.1 | 140.1 | 2.9 | 6.1 |
| **ද.දේ.නි.** | **126.6** | **131.8** | **142.7** | **4.1** | **8.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

2017 වසරේ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම වූ ඉහළ මිල විචලන නිසා දේශීයව නිපදවන සියලුම භාණ්ඩ සහ සේවාවල සමස්ත මිල වෙනස්වීම මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගියේය. කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල මිල 2016 වසරේ දී වාර්තා වූ පිළිවෙළින් සියයට 3.3, සියයට 3.2 සහ සියයට 2.9 සිට 2017 වසරේ දී සියයට 15.9, සියයට 7.1 සහ සියයට 6.1 දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය 2016 වසරේ වූ සියයට 4.1 ට සාපේක්ෂව 2017 වසරේ දී සියයට 8.2 දක්වා ඉහළ ගියේය.

## උද්ධමන අපේක්ෂා

ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූපව හැසිරුණු අතර කෙටිකාලීන සහ දිගුකාලීන උද්ධමන අපේක්ෂා අතර පරතරය අඩු විය. පසුගිය කාලය සලකා බලන කළ උද්ධමන අපේක්ෂා, ඇතැම් අවස්ථාවල දී කාල පමාවක් සහිතව වුවද මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රමවේදවලට සමීපව ප්‍රතිචාර දක්වා ඇත. තවද, ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂාවල ප්‍රවණතාවය, ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. මගින් පෙන්නුම් කළ සැබෑ උද්ධමන ප්‍රවණතා සමඟ මනාව ගැලපුණි. පිළිතුරු සපයන්නන් විසින් ඔවුන්ගේ අපේක්ෂිත උද්ධමන මට්ටම සඳහා සඳහන් කළ හේතු අතර සැපයුම් අංශයේ සිදු වූ අඩාල වීම් සහ දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය අගය පිළිබඳ ඔවුන්ගේ මතය ඇතුළත් විය. තවද, කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා ස්වභාවයෙන්ම ගත් කළ ව්‍යාපාර අංශයේ අපේක්ෂාවලට වඩා ඉහළ මට්ටමක පැවතිය ද, එය සාමාන්‍ය මිල මට්ටම්වල සිදු වූ ඉහළ යෑම්වලට අනුරූපව හැසිරුණි.

විශේෂ සටහන 3

## උද්ධමන අපේක්ෂා මිනුම්ගත කිරීම

අනාගත උද්ධමනය පිළිබඳ ආර්ථික නියෝජිතයන්ගේ මතය හෝ දැක්ම උද්ධමන අපේක්ෂා ලෙස අර්ථ දැක්විය හැක. මිල ස්ථායිතාව අරමුණු කර ගත් මහ බැංකු, සුදුසු මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී මෙම උද්ධමන අපේක්ෂා දෙස වැඩි අවධානයක් යොමු කරයි. අධ්‍යයන වාර්තා තුළින් පෙනී යන පරිදි ද, උද්ධමන ඉලක්කයක් කරා ළඟාවීම සඳහා ආයතනිකමය වශයෙන් කරනු ලබන කැපවීම මිල ස්ථායිතාව ප්‍රවර්ධනය කරයි (Mishkin, 2011). ආර්ථිකයේ වැටුප් හා මිල නියම කිරීමෙහිලා උද්ධමන අපේක්ෂා බලපෑම් කරන අතර, ඒ අනුව බලන කළ, උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් බව පැහැදිලි වේ. කෙටිකාලීන උද්ධමන අපේක්ෂාවල අඛණ්ඩ වැඩිවීම, මධ්‍ය කාලීනව ඇතිවිය හැකි උද්ධමන පීඩන තත්ත්ව පිළිබඳ සංඥා සපයන අතර, එය මිල ස්ථායිතාව පවත්වාගෙන යාම අරමුණු කරගත් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සැලකිල්ලට ගතයුතු වැදගත් සාධකයකි (Patra and Ray, 2010). ඒ අතරම, උද්ධමනය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමෙහිලා මහ බැංකුවල කාර්යභාරය පිළිබඳව මහජනතාවගේ විශ්වසනීයත්වය, දිගු කාලීන උද්ධමන අපේක්ෂා තුළින් පෙන්නුම් කරයි. උද්ධමන අපේක්ෂා ඉලක්කගත උද්ධමනයට ආසන්න අගයක පැවතීම, මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව හා මිල ස්ථායිතාව ලඟාකරගැනීම පිළිබඳ මහ බැංකුවේ කාර්යභාරය කෙරෙහි පවතින විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට ඉවහල් වන හෙයින් විශේෂයෙන්ම උද්ධමන ඉලක්කකරණ රාමුව තුළින් මුදල් ප්‍රතිපත්ති හසුරුවන මහ බැංකු, උද්ධමන අපේක්ෂා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි (Bernanke, 2007). මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (Flexible Inflation Targeting) රාමුවක් වෙත වැඩි දියුණු කිරීමේ දී, එහි ප්‍රධාන අරමුණක් වන මිල ස්ථායිතාව ලඟාකර ගැනීම සඳහා, උද්ධමන අපේක්ෂා මිනුම්ගත කිරීම බෙහෙවින් වැදගත් වේ.

තත්කාලීනව නිරීක්ෂණය කළ නොහැකි උද්ධමන අපේක්ෂා, විවිධ ක්‍රම තුළින් මිනුම්ගත කළ හැකි අතර උද්ධමන පුරෝකථනයේ දී මෙන්ම මුදල් ප්‍රතිපත්තියේ අනාගත දිශානතිය තීරණය කිරීමේ දී ද මෙම උද්ධමන අපේක්ෂා ප්‍රයෝජනවත් වේ. උද්ධමන අපේක්ෂා මිනුම්ගත කරන ප්‍රධාන ක්‍රම ලෙස, සමීක්ෂණ පදනම් කරගත් මිනුම් හා මූල්‍ය වෙළඳපොළ තුළින් ගම්‍යවන තොරතුරු පදනම් කරගත් මිනුම් දැක්විය හැක (Adeney, Arsov & Evans, 2017)[1]. සමීක්ෂණ තුළින් අනාගත උද්ධමන අපේක්ෂා මැනීමේ දී පොදුජනතාවගේ කෙටිකාලීන, මැදිකාලීන හා දිගුකාලීන උද්ධමනය පිළිබඳ විමසීම් කෙරේ. සාමාන්‍යයෙන් උද්ධමන අපේක්ෂා සමීක්ෂණ සඳහා කුටුම්භ, ව්‍යාපාර හා වෘත්තිකයන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීමක් සිදු කෙරේ. මෙම සමීක්ෂණ පවත්වන කාල පරාස මාසිකව සිට අර්ධ වාර්ෂිකව දක්වා වෙනස් වේ. මූල්‍ය වෙළඳපොළ තුළින් ගම්‍යවන තොරතුරු මත පදනම්ව උද්ධමන අපේක්ෂා මැනීමේ දී, එය ඉදිරි අපේක්ෂිත උද්ධමනයට වඩාත් සම්බන්ධ මූල්‍ය උපකරණවල නිරීක්ෂිත මිල ගණන් තුළින් සිදු කෙරේ. මේ සඳහා වැඩි වශයෙන්ම, දර්ශක හා සම්බන්ධ වූ මූල්‍ය උපකරණවල මිල භාවිතා කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ උද්ධමනය මිනුම්ගත කිරීම සලකා බැලූ විට, සමීක්ෂණ මත පදනම්ව උද්ධමන අපේක්ෂා මිනුම් ගත කිරීම, 2006 වසර තරම් ඈතට දිවෙන අතර එතැන් පටන් ගුණාත්මක හා කාලීන බවින් වැඩිදියුණු වූ ප්‍රතිචාර ලබාගැනීම අරමුණු කරගෙන, විවිධ අවස්ථාවල දී පුළුල් ප්‍රතිචාර පදනමක් ඔස්සේ මෙම සමීක්ෂණය වැඩි දියුණු විය. උද්ධමන අපේක්ෂා සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් කොටස් 3 කට වර්ගීකරණය කෙරේ. එනම්, ව්‍යාපාරික අංශය, කුටුම්භ අංශය හා අධ්‍යයන අංශය ලෙසිනි. ව්‍යාපාරික අංශය ගත්කළ, ශ්‍රී ලංකා මහ බැංකුව විද්‍යුත් තැපැල මගින් ප්‍රතිචාර දක්වන්නන් සමග සම්බන්ධ වන අතර ඔවුන් වත්මන් මාසය, ඉදිරි මාස තුන, හය සහ දොළහ යන කාලපරිච්ඡේද සඳහා

රූප සටහන වි.ස. 3.1

### උද්ධමන අපේක්ෂා මැනීම




1 එක්සත් ජනපදය, යුරෝ කලාපය, ජපානය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ ස්වීඩනය උද්ධමන අපේක්ෂා මැනීමේ දී මෙම ක්‍රම ද්විත්වයම භාවිතා කරන අතර, නවසීලන්තය, ඉන්දියාව සහ කැනඩාව වැනි රටවල් සමීක්ෂණ පාදක කරගත් මිනුම් ක්‍රම උද්ධමන අපේක්ෂා මැනීම සඳහා භාවිතා කරනු ලබයි.

4

අපේක්ෂිත උද්ධමන අගයක් ලබාදෙයි. ව්‍යාපාරික අංශයේ නියැදි රාමුව, මූල්‍ය වෙළඳපොළෙහි සාමාජික ආයතන[2], කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම් සහ ලංකා වාණිජ මණ්ඩලයේ සාමාජික සමාගම්වලින් සමන්විත වේ. කුටුම්භ අංශය සළකා බලන කළ, ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව හා තොරතුරු දැනගැනීමේ හැකියාව ව්‍යාපාරික අංශයට සාපේක්ෂව අඩු මට්ටමක පවතින හෙයින්, ඔවුන් සඳහා සමීක්ෂණය ආරම්භයේ දී කණ්ඩායම් සාකච්ඡා මගින් උද්ධමනය පිළිබඳව කෙටි හැඳින්වීමක් ලබා දෙයි. මෙහිදී කුටුම්භ අංශයේ සමීක්ෂණයට, කොළඹ දිස්ත්‍රික්කය තුළ අහඹු ලෙස තෝරාගත් රාජ්‍ය ආයතනවල සේවක/සේවිකාවන්[3] අයත් වන අතර ඉදිරි කාලය සඳහා ඔවුන්ගේ උද්ධමන අපේක්ෂා "පරාසය" පිළිබඳ විමසීමක් කෙරේ. මීට අමතරව, 2017 මැද භාගයේ සිට උද්ධමන අපේක්ෂා සමීක්ෂණය අධ්‍යයන අංශය ද ඇතුලත් වන ලෙස පුළුල් කරන ලද අතර එමගින් රජයේ විශ්ව විද්‍යාලවල ආචාර්යවරුන්ගෙන් ඉදිරි කාලය සඳහා අපේක්ෂිත උද්ධමන අනුපාතිකය විමසනු ලැබේ. අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙලෙස එකතු කර ගන්නා දත්ත විශ්ලේෂණය කොට, එහි මධ්‍යස්ථ අගයක් ලෙස උද්ධමන අපේක්ෂා ඉදිරිපත් කෙරේ.

රූප සටහන වි.ස. 3.2
**උද්ධමන අපේක්ෂා සමීක්ෂණයෙහි සංයුතිය**




### ශ්‍රී ලංකාවේ උද්ධමන අපේක්ෂාවල හැසිරීම

විශේෂයෙන්ම ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) යන දර්ශක දෙකෙහිම වෙනස මගින් මනිනු ලබන සැබෑ උද්ධමනයේ ප්‍රවණතා සමග අනුකූල වන බව පෙන්නුම් කරයි.

පසුගිය වසරවල නිරීක්ෂණය කළ පරිදි, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්වලට අනුකූලව උද්ධමන අපේක්ෂා වෙනස්වන අතර, එය සමහර අවස්ථාවල දී කාල පමාවක් සහිතව සිදු වේ. උදාහරණයක් වශයෙන්, පසුගිය කාලවල දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග තුළින් ඉදිරියේ දී ඇතිවිය හැකි මිල

රූප සටහන වි.ස. 3.3
**උද්ධමනය අපේක්ෂා සහ සැබෑ උද්ධමනය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වැඩිවීම පාලනය වේ යැයි ප්‍රතිචාර දක්වන්නන් විශ්වාස කළ අතර, ඒ අනුව ඔවුන්ගේ උද්ධමන අපේක්ෂාවල අඩු වීමක් හෝ වැඩි නොවීමක් සිදු විය. තවද, 2016 මැයි මාසයේ දී රජයේ බදු ව්‍යුහයට හඳුන්වාදුන් වෙනස්කම්වලින් පසුව, සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කළ පරිදි, උද්ධමන අපේක්ෂාවල වැඩිවීමක් වාර්තා විය.

මෑත කාලීන සමීක්ෂණ ප්‍රතිඵලවලින් තවදුරටත් පෙන්නුම් කළ පරිදි, ව්‍යාපාරික අංශයේ කෙටිකාලීන හා දිගුකාලීන උද්ධමන අපේක්ෂා මට්ටම් අතර පවතින පරතරයේ ද අඩුවීමක් සිදුවිය. මෙමගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රතිචාර දක්වන්නන් ඉදිරියේ දී උද්ධමනයේ අඩු විචලන අපේක්ෂා කරන බවයි. දේශීය සැපයුම් තත්ත්ව හා දේශීය මුදලේ විදේශීය අගය පිළිබඳ ඔවුන්ගේ දැක්ම යන හේතු, 2017 වසරේ ව්‍යාපාරික අංශයේ අපේක්ෂිත උද්ධමනයට බලපෑ ප්‍රධාන හේතු ලෙස සමීක්ෂණයෙන් හෙළිවිය. කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා ද ප්‍රතිපත්තිමය

රූප සටහන වි.ස. 3.4
**ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2 බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, ප්‍රාථමික වෙළෙඳුන් සහ රක්ෂණ ආයතන

3 නැඹුරුතා මගහැරීම සඳහා ආයතනවල විවිධ වැටුප් මට්ටම්වල සේවකයන් සමීක්ෂණයට සහභාගි කරගනු ලබයි.

වෙනස්කම්වලට අනුකූලව හැඩගැසෙන අතර, එවැනි අවස්ථාවල දී ඔවුන්ගේ උද්ධමන අපේක්ෂාවල වෙනස්වීම් සාමාන්‍යයෙන් ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂාවල සිදුවන වෙනස්වීම්වලට වඩා වැඩිය. තවද, මෑතකදී ආරම්භ කරන ලද අධ්‍යයන අංශය සඳහා වූ උද්ධමන අපේක්ෂා සමීක්ෂණය ද මීට සමාන ප්‍රවණතා පෙන්නුම් කරන අතර ඔවුන්ගේ උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට ආසන්න වශයෙන් හැසිරුණි.

**ඉදිරි දැක්ම**

උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වාගෙන යාමේ දී සමස්ත රටම ආවරණය වීමේ වැදගත්කම වෙනත් රටවල එම සමීක්ෂණය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. කෙසේවෙතත්, වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ ප්‍රධානම සීමාකම වනුයේ එය කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා වී තිබීමයි. එබැවින්, උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයට අනුකූලව සිදු කරන දීප ව්‍යාප්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ යටතේ (CWDCS)[4] කොළඹ දිස්ත්‍රික්කයෙන් ඔබ්බට සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලසුම් කරනු ලබයි. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළෙහි තත්කාලීන දත්ත කළමණාකරණය, ටැබ්ලට් පරිගණක තුළ අන්තර්ගත කළ මෘදුකාංගයක් (App) මගින් සිදු කරයි. මේ අනුව, මෙම ක්‍රමවේදය හරහා උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වාගෙන යාම මගින් කුටුම්භ අංශයේ ආවරණය සහ ඔවුන්ගේ උද්ධමන අපේක්ෂාවල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.

වසර කිහිපයක සිට නිරීක්ෂණය කළ පරිදි, කුටුම්භ අංශයේ තනි පුද්ගල උද්ධමන අපේක්ෂා ඉහළ මට්ටමක පවතින අතර ඒ සඳහා ආර්ථික විද්‍යාව පිළිබඳව ඔවුන්ගේ පවතින සීමිත දැනුම සහ පහළ මට්ටමක පවතින මූල්‍ය සාක්ෂරතාව හේතු විය හැකිය. මෙම ගැටලුව විසඳීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ජාලය භාවිතා කරමින් උද්ධමන මතය පිළිබඳ සමීක්ෂණයක් (Inflation Perception Survey) හඳුන්වා දීමට කටයුතු කරමින් සිටින අතර එමගින් කුටුම්භ අංශයේ ඉදිරි මාස 03 සහ මාස 12 සඳහා, ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩවල පාරිභෝගික වියදමෙහි අපේක්ෂිත වෙනස්වීම පිළිබඳව ගුණාත්මක ප්‍රතිචාර ලබා ගැනීම සිදුවනු ඇත. මෙම උද්ධමන මතය පිළිබඳ සමීක්ෂණය මගින් උද්ධමනය පිළිබඳ අමතර අවබෝධයක් ලබා දෙන අතර එමගින් කුටුම්භ අංශයේ සැබෑ උද්ධමන අපේක්ෂා පිළිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීමට අපේක්ෂා කෙරේ. ඉන්දියාව උද්ධමන මතය සහ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ කාලානුරූපව වැඩිදියුණු කළ ආකාරය පිළිබඳ අත්දැකීම් (Mohanty, 2012) ඇසුරින් ශ්‍රී ලංකාවේ මෙම සමීක්ෂණද කාලානුරූපව නිරන්තරයෙන් වැඩි දියුණු කළ හැකිය. ඉහළ මූල්‍ය සාක්ෂරතාවය, පොදු ජනතාවගේ උද්ධමන අපේක්ෂා සකස්වීමේ ක්‍රියාවලිය දියුණු කරනු ලබන අතර, එය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ක්‍රමවේදය යටතේ මුදල් ප්‍රතිපත්තියෙහි සඵලතාවය කෙරෙහි ඉතා වැදගත් කර්යයභාරයක් ඉටුකරනු ඇත.

4 දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩසටහන මගින්, පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදක මිල ගණන් සහ අවිධිමත් අංශයේ දෛනික වැටුප් එකරැස් කරනු ලබයි.

මූලාශ්‍ර:


Bernanke, B.S. (2007), “Inflation Expectations and Inflation Forecasting”, at the Monetary Economics workshop of the NBER Summer Institute, Cambridge. https://www.federalreserve.gov/newsevents/speech/bernanke20070710a.htm, Accessed on 15 March 2018.

Adeney, R., Arsov, I. and Evans, R. (2017), "Inflation expectations in advanced economies." Reserve Bank of Australia Quarterly Bulletin, March 2017, pages 31-41.

Mishkin, F.S. (2011), “Monetary Policy Strategy: Lessons from the Crisis”, NBER Working Paper No. W16755. Available at SSRN: https://ssrn.com/abstract=1754908, Accessed on 10 March 2018.

Mohanty, D. (2012), “The importance of inflation expectations”, at the S P Jain Institute of Management & Research, Mumbai.

Patra, M.D, Ray, P (2010), “Inflation Expectations and Monetary Policy in India: An Empirical Exploration”, IMF Working Paper No. WP/10/84


4

## 4.3 වැටුප්

**2017 වසර තුළ දී වැටුප් ප්‍රමාණ දර්ශක මගින් පෙන්නුම් කළ පරිදි මූර්ත වැටුප් පහළ යෑමේ ප්‍රවණතාව සමග ආර්ථිකයෙහි වැටුප් පීඩනයක් ඇති බව පෙන්නුම් කරන ලදී.** මෙම තත්ත්වය, 2017 වසරේ දී උද්ධමනයේ ඉහළ යෑමට වඩා අඩු වේගයකින් නාමික වැටුප් ඉහළ යෑම හේතුවෙන් සිදු වූ අතර, එය රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශවල විශේෂයෙන් දක්නට ලැබිණි. කෙසේ වුවද, වැටුප් මගින් පොදු මිල මට්ටම මත ඇති කරන ඉල්ලුම් පීඩනය වසර මුළුල්ලෙහි අඩු මට්ටමක පැවතුණි.

### රාජ්‍ය අංශයේ වැටුප්

**2017 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ දළ වැටුප නොවෙනස්ව පැවතුණි.** කෙසේ වුවද, විශේෂ දීමනා සහ අන්තර් අතුරු දීමනා මූලික වැටුපට අන්තර්ග්‍රහනය කිරීම 2017 වසරේ දී ද අඛණ්ඩව සිදු විය. ඒ අනුව, රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2016 වසරේ වාර්තා වූ සියයට 3.9 ක වැඩිවීමට සාපේක්ෂව 2017 වසරේ දී නොවෙනස්ව පැවතුණි. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සලකා බලන කළ 2016

**4.6 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | මූර්ත | | නාමික | | මූර්ත | |
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| 1. රජයේ සේවකයන් | | | | | | | | |
| **සියලුම රජයේ සේවකයන් (2012=100)** | **160.8** | **160.8** | **140.9 (අ)** | **130.9 (අ)** | **3.9** | **0.0** | **-0.1** | **-7.2** |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් | 170.4 | 170.4 | 149.4 (අ) | 138.7 (අ) | 4.6 | 0.0 | 0.6 | -7.2 |
| ද්විතීයික මට්ටමේ නිලධාරීන් | 161.6 | 161.6 | 141.7 (අ) | 131.5 (අ) | 3.7 | 0.0 | -0.2 | -7.2 |
| තෘතීයික මට්ටමේ නිලධාරීන් | 155.5 | 155.5 | 136.3 (අ) | 126.6 (අ) | 4.4 | 0.0 | 0.4 | -7.2 |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් | 141.4 | 141.4 | 123.9 (අ) | 115.0 (අ) | 5.0 | 0.0 | 1.0 | -7.2 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | |
| **සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් (1978 දෙසැ=100)** | **4,127.9** | **4,128.6** | **103.5 (ආ)** | **97.4 (ආ)** | **0.0** | **0.0** | **-3.6** | **-5.9** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලෙන කම්කරුවන් | 4,735.7 | 4,736.7 | 118.8 (ආ) | 111.8 (ආ) | 0.0 | 0.0 | -3.5 | -5.9 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලෙන කම්කරුවන් | 3,459.1 | 3,459.1 | 86.8 (ආ) | 81.6 (ආ) | 0.0 | 0.0 | -3.6 | -5.9 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 2,313.2 | 2,313.2 | 58.0 (ආ) | 54.6 (ආ) | 0.0 | 0.0 | -3.6 | -5.9 |
| 3. අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් | | | | | | | | |
| **සියලුම අවිධිමත් පෞද්ගලික අංශ (2012=100)** | **136.7** | **149.7** | **119.8 (අ)** | **121.8 (අ)** | **7.9** | **9.5** | **3.7** | **1.7** |
| කෘෂිකර්මාන්ත | 136.9 | 150.9 | 119.9 (අ) | 122.8 (අ) | 6.7 | 10.3 | 2.6 | 2.3 |
| කර්මාන්ත | 140.7 | 155.0 | 123.3 (අ) | 126.1 (අ) | 9.1 | 10.2 | 4.9 | 2.3 |
| සේවා | 132.8 | 144.1 | 116.4 (අ) | 117.2 (අ) | 7.2 | 8.5 | 3.1 | 0.7 |

(අ) ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වේ.
(ආ) කො.පා.මි.ද. (2006/07=100) මත පදනම් වේ.

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4

වසරේ මූර්ත වැටුප් හි සිදු වූ සියයට 0.1 ක සුළු පහළ යෑමට සාපේක්ෂව, උද්ධමන ප්‍රවණතා හේතුවෙන් 2017 වසරේ දී එය සියයට 7.2 කින් පහළ යන ලදී.

## පෞද්ගලික අංශයේ වැටුප්

**2017 වසරේ දී විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් සුළු වශයෙන් ඉහළ ගියේය.** එය කම්කරු දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන පඩි පාලක සභා විසින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි[2] (1978=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලැබේ. කෙසේ වුවද, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2016 වසරේ සිදු වූ සියයට 3.6 ක පහළ යෑමට සාපේක්ෂව 2017 වසරේ දී සියයට 5.9 කින් පහළ යන ලදී.

**4.4 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක (වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස)**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කම්කරු දෙපාර්තමේන්තුව

**වෙළඳපොළ තත්ත්ව මත වැටුප් තීරණය වන අවිධිමත් පෞද්ගලික අංශයෙහි නාමික සහ මූර්ත වැටුප්වල ඉහළ යෑමක් 2017 වසරේ දී දක්නට ලැබිණි.** ඒ අනුව, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, පෙර වසරේ වාර්තා වූ සියයට 7.9 ක ඉහළ යෑමට සාපේක්ෂව 2017 වසරේ දී සියයට 9.5 කින් ඉහළ ගියේය. 2017 වසරේ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන උප අංශ තුනෙහිම නාමික වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින් සියයට 10.3 කින්, සියයට 10.2 කින් සහ සියයට 8.5 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයෙහි ශීඝ්‍ර වර්ධනයත් සමග පෙදරේරු සහ වඩු කාර්මික වෘත්තීන්හි ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ දී එම වෘත්තීන්හි නාමික වැටුප්වල පිළිවෙළින් සියයට 12.5 ක සහ

2 නාමික දර්ශකය ගණනය කිරීමේ දී පඩි පාලක සභා 21 ක අවම වැටුප් සලකා බලන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි මූර්ත දර්ශකය ගණනය කරනු ලබයි.

සියයට 11.2 ක ඉහළ යෑමක් දක්නට ලැබිණි. 2016 වසරේ දී වාර්තා වූ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 1.7 කින් වර්ධනය විය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**2017 වසරේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 21.4 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 2016 වසරේ පැවති සියයට 1.1 ක අගයෙහි නොවෙනස්ව පැවතිණි.** මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් මිලියන 10.4 ක් (සියයට 48.4 ක්) පුරුෂයන් වන අතර මිලියන 11.1 ක් (සියයට 51.6 ක්) ස්ත්‍රීන් විය. 2017 වසරේ දී වයස අවුරුදු 15 ට අඩු, අවුරුදු 15-59 දක්වා සහ අවුරුදු 60 සහ ඊට වැඩි වයස් කාණ්ඩවල ජනගහනය මුළු ජනගහනයෙන් පිළිවෙළින් සියයට 25.2 ක්, සියයට 62.4 ක් සහ සියයට 12.4 ක් විය. 2016 වසරේ දී 338 ක් වූ ජන ඝනත්වය[3] සියලුම දිස්ත්‍රික්කවල දායකත්වයෙන් 2017 වසරේ දී 342 දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. ද.දේ. නිෂ්පාදිතයට ප්‍රමුඛතම දායකත්වය සපයන බස්නාහිර පළාත, 2017 වසරේ දී මුළු මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 28.4 ක් නියෝජනය කළ අතර මධ්‍යම, දකුණ සහ වයඹ පළාත් පිළිවෙළින් සියයට 12.7 ක, සියයට 12.2 ක සහ සියයට 11.7 ක දායකත්වයක් ලබා දෙන ලදී.

**4.7 සංඛ්‍යා සටහන**

**දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| දිස්ත්‍රික්කය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය (ඇ) | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය (ඇ) |
| කොළඹ | 2,395 | 3,543 | 2,419 | 3,578 |
| ගම්පහ | 2,372 | 1,769 | 2,391 | 1,783 |
| කළුතර | 1,261 | 800 | 1,271 | 806 |
| මහනුවර | 1,434 | 748 | 1,452 | 757 |
| මාතලේ | 508 | 260 | 514 | 263 |
| නුවරඑළිය | 748 | 438 | 756 | 443 |
| ගාල්ල | 1,102 | 682 | 1,113 | 688 |
| මාතර | 845 | 665 | 851 | 670 |
| හම්බන්තොට | 637 | 255 | 647 | 259 |
| යාපනය | 602 | 648 | 608 | 654 |
| මන්නාරම | 106 | 56 | 107 | 57 |
| වව්නියාව | 182 | 98 | 184 | 99 |
| මුලතිව් | 95 | 39 | 96 | 40 |
| කිලිනොච්චිය | 122 | 101 | 124 | 103 |
| මඩකලපුව | 550 | 211 | 560 | 215 |
| අම්පාර | 691 | 164 | 705 | 167 |
| ත්‍රිකුණාමලය | 404 | 160 | 412 | 163 |
| කුරුණෑගල | 1,676 | 362 | 1,694 | 366 |
| පුත්තලම | 801 | 278 | 814 | 282 |
| අනුරාධපුරය | 905 | 136 | 918 | 138 |
| පොළොන්නරුව | 425 | 138 | 431 | 140 |
| බදුල්ල | 854 | 302 | 864 | 306 |
| මොණරාගල | 479 | 87 | 485 | 88 |
| රත්නපුරය | 1,140 | 352 | 1,151 | 356 |
| කෑගල්ල | 869 | 516 | 877 | 520 |
| **සමස්ත දිවයින** | **21,203** | **338** | **21,444** | **342** |

(අ) තාවකාලික

(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

(ඇ) වර්ග කි.මී.ට පුද්ගලයන්

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**1981 වසරේ දී මුළු ජනගහනයෙන් සියයට 6.6 ක් වූ වයස අවුරුදු 60 සහ ඊට වැඩි පුද්ගලයන්ගේ ප්‍රතිශතය වර්තමානයේ දී සියයට 12.4 ක්[4] වීම තුළින්, ශ්‍රී ලංකාව ජනගහනය වයස්ගත වීමේ සංසිද්ධියක් අත්දකිමින් සිටින බව පෙන්නුම් කෙරේ.** මෙම කාලය තුළ ජනගහනයෙහි මධ්‍යස්ථ වයස[5] අවුරුදු 21 සිට අවුරුදු 30 දක්වා ඉහළ යෑම සහ වයස්ගත යැපුම් අනුපාතය[6] සියයට 12 සිට සියයට 20 දක්වා ඉහළ යෑම තුළින් මෙය තවදුරටත් තහවුරු වේ. මෙවැනි වාතාවරණයක් ඇති වීමට ජනගහන වර්ධනය අඩු මට්ටමක පැවතීම මෙන්ම ආයු අපේක්ෂාව සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම වැනි හේතු බලපා ඇත. මෙවැනි ජනගහන ප්‍රවණතා හේතුවෙන් ශ්‍රම බලකා සහභාගිත්වය අඩුවීම, යැපුම් අනුපාතය වැඩිවීම, ඵලදායිතාව අඩුවීම, ඉතුරුම් අනුපාතික අඩුවීම සහ සමාජ සුභසාධනය සඳහා රජයේ වියදම් වැඩි වීම වැනි බරපතල අභියෝග ආර්ථිකයට ඇතිවිය හැකි බැවින් එම අභියෝග විසඳීම සඳහා සැලකිය යුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. ඒ අනුව, ඇති විය හැකි සමාජ ආර්ථික අවදානම් අඩු කිරීම සඳහා නිපුණතා වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග තුළින් වයස්ගත ජනගහනය ඵලදායී ක්‍රියාකාරකම්වල යෙදවීම, විශ්‍රාම සැලසුම් පිළිබඳව දැනුම්වත් කිරීම, දායකත්ව විශ්‍රාම අරමුදල් යෝජනා ක්‍රමවලට සහභාගී වීමට දිරිමත් කිරීම සහ වයස්ගත වූවන් රැකබලා ගැනීමේ අංශයෙහි නිපුණතා වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපත්ති සම්පාදනය විය යුතුය.

### ශ්‍රම බලකාය

**පසුගිය වසර පහක කාලය තුළ පෙන්නුම් කළ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2017 වසරේ දී ශ්‍රම බලකාය 2016 වසරට සාපේක්ෂව සියයට 3.1 කින් වර්ධනය විය.** වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික

3 වර්ග කිලෝමීටරයක භූමි ප්‍රදේශයක සිටින පුද්ගලයන් සංඛ්‍යාව

4,5 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

6 වයස අවුරුදු 60 සහ ඊට වැඩි පුද්ගලයන් සංඛ්‍යාව අවුරුදු 15-59 වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

### 4.5 රූප සටහන
### ශ්‍රම බලකායේ සහ සේවා වියුක්තියේ ප්‍රවණතා (2012-2017)




සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012 පළමුවන කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පවත්වා නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



වශයෙන් සක්‍රීය ජනගහනය[7] ලෙස අර්ථ දැක්වෙන ශ්‍රම බලකාය, 2016 වසරේ වාර්තා වූ මිලියන 8.311 ට සාපේක්ෂව 2017 වසරේ දී මිලියන 8.567 ක් විය. ආර්ථිකයෙහි රැකියා අවස්ථාවල වර්ධනයක් පෙන්නුම් කරමින් ශ්‍රම බලකායෙහි වර්ධනයත් සමගම සේවා නියුක්ති ජනගහනය සියයට 3.3 කින් වර්ධනය වූ අතර සේවා වියුක්ති ජනගහනය පහළ ගියේය. කෙසේ වුවද, ආර්ථික වශයෙන් සක්‍රීය සහ අක්‍රීය පුද්ගලයන් දෙපාර්ශවයම ඇතුළත් කුටුම්බ ජනගහනයෙහි සිදු වූ වර්ධනය හේතුවෙන් ශ්‍රම බලකායෙහි සිදු වූ මෙම සැලකිය යුතු වැඩිවීම මධ්‍යයේ වුවද ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය[8] සුළු වශයෙන් පමණක් වර්ධනය විය. ඒ අනුව, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2016 වසරේ පැවති සියයට 53.8 හි සිට 2017 වසරේ දී සියයට 54.1 දක්වා මධ්‍යස්ථ වශයෙන් වර්ධනය විය.

**2017 වසරේ දී ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සහභාගිත්ව පරතරය අඩු වීමක් පෙන්නුම් කළ ද තවදුරටත් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්වයට පක්ෂව පැවතුණි.** 2017 වසරේ දී පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 74.5 ක් වූ අතර ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 36.6 ක් විය. ඒ අනුව, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අත්කර ගන්නා කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගිය ද ශ්‍රී ලංකා ශ්‍රම බලකායෙහි ඌන කාන්තා නියෝජනයක් පවතී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයෙන් හඳුනාගත් පරිදි කාන්තාවන් ආර්ථිකමය වශයෙන් අක්‍රීය වීමට ප්‍රධානතම හේතුව වන්නේ ඔවුන් ගෘහ කටයුතුවල යෙදීමයි. තවද,

### 4.8 සංඛ්‍යා සටහන
### කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)(ආ)

| ශීර්ෂය | 2016 | 2017 (ඇ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000** | **15,449** | **15,684** | **15,814** | **15,894** | **15,983** | **15,844** |
| **ශ්‍රම බලකාය පුද්ගලයන් '000** | **8,311** | **8,583** | **8,519** | **8,522** | **8,642** | **8,567** |
| සේවා නියුක්ත | 7,948 | 8,230 | 8,139 | 8,164 | 8,300 | 8,208 |
| සේවා වියුක්ත | 363 | 353 | 381 | 358 | 342 | 358 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)** | **53.8** | **54.7** | **53.9** | **53.6** | **54.1** | **54.1** |
| පුරුෂ | 75.1 | 75.1 | 74.6 | 73.6 | 74.9 | 74.5 |
| ස්ත්‍රී | 35.9 | 37.6 | 35.9 | 36.6 | 36.4 | 36.6 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) තාවකාලික
(ඈ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### 4.6 රූප සටහන
### ස්ත්‍රී - පුරුෂ භාවය අනුව ආර්ථික වශයෙන් අක්‍රීය වීම සඳහා හේතු (%) - 2016




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

7 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අදාල කාලපරිච්ඡේදය තුළ දී සේවා නියුක්තව හෝ සේවා වියුක්තව සිටින පුද්ගලයන් ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනයට අයත් වේ.

8 ශ්‍රම බලකාය සහ වයස අවුරුදු 15 හා ඊට වැඩි කුටුම්බ ජනගහනය අතර අනුපාතය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය යි.

සිංගප්පූරුව, චීනය, ඉන්දියාව, පිලිපීනය, තායිලන්තය සහ වියට්නාමය වැනි ආර්ථික සමග සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ රාත්‍රී වැඩමුර සහ මාතෘ නිවාඩු පිළිබඳ විධි විධාන සම්බන්ධයෙන් පසුගාමී තත්ත්වයක් පවතින බව ශ්‍රම වෙළඳපොළ රෙගුලාසි (Labour Market Regulation) පිළිබඳ ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකයෙහි (Doing Business Index) දත්ත සමුදාය[9] පෙන්නුම් කරයි. ඒ අනුව, පෙර අවස්ථා කිහිපයකදීම ඉස්මතු කළ ආකාරයට කාන්තාවන් සඳහා ප්‍රමාණවත් පරිදි හිතකර රැකියා තත්ත්ව නිර්මාණය කිරීමට ජාතික මට්ටමේ ප්‍රතිපත්ති අවශ්‍යය වේ. ළමා හා වැඩිහිටි සුරැකුම් පහසුකම්, නම්‍යශීලී පැය පදනම මත සහ අර්ධකාලීන රැකියා අවස්ථා සහ වැඩිදියුණු කළ ප්‍රවාහන පහසුකම් ලබාදීම ඒ අතරට ඇතුළත් විය හැකිය. රජයේ ඉදිරි ගමන් මග දැක්වෙන "2025 පොහොසත් රටක්" රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ද අඩු ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික ගැටළුව විසඳීමට පිළියම් කිහිපයක් හඳුනාගෙන ඇති අතර අපේක්ෂිත ආර්ථික දැක්ම මුදුන්පත් කර ගැනීමට මෙම ක්‍රියාමාර්ග දැඩි හා ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීම තුළින් නිෂ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රම සැපයුම වැඩිවීම පමණක් නොව ස්ත්‍රී-පුරුෂ විවිධත්වය තුළින් ගෙන එන නව හැකියා සහ කුසලතා මගින් ශ්‍රම බලකායේ ගුණාත්මක බව වර්ධනය වීමද සිදු වේ.

9 ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය (Doing Business Index) ලෝක බැංකු සමූහය විසින් ගණනය කර ප්‍රකාශයට පත් කරන අතර ශ්‍රම වෙළඳපොළ රෙගුලාසි උප ක්ෂේත්‍රය මගින් විශේෂයෙන් බඳවා ගැනීම්, වැඩ කරන පැය සහ ඉවත් කිරීම් සම්බන්ධ ක්ෂේත්‍රවලට අදාළ සේවා නියුක්ති රෙගුලාසිවල නම්‍යශීලී බව පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි.

**4.7 රූප සටහන**

**රැකියාවේ සේවා තත්ත්වය සහ ස්ත්‍රී - පුරුෂ භාවය අනුව සේවා නියුක්තියේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2016**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සේවා නියුක්තිය

**ආර්ථිකයෙහි සේවා නියුක්ති ව්‍යුහයේ වෙනස් වීම මධ්‍යයේ 2017 වසරේ දී සේවා නියුක්ත පුද්ගලයන්ගේ සංඛ්‍යාව ඉහළ ගියේය.** ඒ අනුව, සේවයේ නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව පෙර වසරේ දී වාර්තා වූ මිලියන 7.948 ට සාපේක්ෂව 2017 වසරේ දී මිලියන 8.208 දක්වා සියයට 3.3 කින් ඉහළ ගියේය. 2017 වසරේ දී මුළු සේවා නියුක්තියෙන් සියයට 45.5 කට දායක වූ සේවා අංශය, අඛණ්ඩව ආර්ථිකයෙහි ප්‍රධානතම රැකියා උත්පාදන අංශය ලෙස වාර්තා විය. මුළු සේවා නියුක්තියෙන් සියයට 14.1 ක් නියෝජනය කරන තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් රථ සහ යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ කටයුතු උප අංශය, සේවා අංශය තුළ වැඩිම සේවා නියුක්ති දායකත්වය සපයන ලදී. 2017 වසරේ දී මුළු සේවා නියුක්තියට කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 28.4 ක් විය. මුළු සේවා නියුක්තියෙන් සියයට 19.3 ක් නියෝජනය කරන නිෂ්පාදන උප අංශය, කර්මාන්ත අංශයෙහි සේවා නියුක්තියට ඉහළම දායකත්වය සපයන ලදී. කෙසේ වුවද, වසර තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වවලින් ඇති වූ අඛණ්ඩ බාධා හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල දක්නට ලැබුණු පහළ යෑම නිසා කෘෂිකර්මාන්ත අංශයෙහි සේවා නියුක්තිය පහළ ගියේය. ඒ අනුව, 2016 වසරේ සියයට 27.1 ක් ලෙස වාර්තා වූ කෘෂිකර්මාන්ත අංශයෙහි සේවා නියුක්ති දායකත්වය, 2017 වසරේ දී සියයට 26.1 දක්වා පහළ ගියේය. කෘෂිකාර්මික කටයුතුවල පහළ යෑම හේතුවෙන් 2017 තෙවන කාර්තුවේ දී කෘෂිකර්මාන්ත අංශයෙහි සේවා නියුක්ති දායකත්වය කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය ආරම්භයේ සිට මේ දක්වා වූ පහළම අගය වාර්තා කළේය.

2017 වසරේ බිහි වූ රැකියා අවස්ථා සංඛ්‍යාව සැලකූ විට **සියලු කාණ්ඩවල සේවා නියුක්තිය ඉහළ ගොස් ඇති අතර පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.** ඒ අනුව, 2017 වසරේ සමස්ත සේවා නියුක්තියෙන් සියයට 43.3 ක් නියෝජනය කළ පෞද්ගලික අංශය තුළ සේවයේ නියුතු පුද්ගලයන් සංඛ්‍යාව 117,405 කින් ඉහළ ගියේය. තවද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ස්වයං රැකියාවල නියුතු වූවන් සංඛ්‍යාව 59,273 කින් වර්ධනය විය. ස්වයං රැකියාවල නියුතු වූවන් සහ සේව්‍යයන් යන කාණ්ඩවල එකතුවෙහි සේවා නියුක්තිය ඉහළ ගිය ප්‍රමාණය, සමස්ත සේවා නියුක්තිය ඉහළ ගිය ප්‍රමාණයෙන් සියයට 34 ක් ලෙස වාර්තා විය. මෙමගින් පෙන්නුම් කෙරෙනුයේ රට තුළ නව ව්‍යාපාර අවස්ථා

**4.9 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)(ඇ)**

| අංශය | පුද්ගලයන් '000 | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 (ඈ) | | | | | 2016 | 2017 (ඈ) |
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | | |
| **කෘෂිකර්මාන්ත** | **2,154** | **2,222** | **2,114** | **1,984** | **2,241** | **2,140** | **27.1** | **26.1** |
| **කර්මාන්ත** | **2,098** | **2,306** | **2,301** | **2,372** | **2,346** | **2,331** | **26.4** | **28.4** |
| පතල් හා කැණීම් | 60 | 50 | 50 | 74 | 79 | 63 | 0.8 | 0.8 |
| නිෂ්පාදන | 1,421 | 1,572 | 1,549 | 1,586 | 1,616 | 1,581 | 17.9 | 19.3 |
| ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජල එකතු කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (ගොවිතැන් කටයුතු හැර) | 617 | 685 | 702 | 712 | 651 | 688 | 7.8 | 8.4 |
| **සේවා** | **3,696** | **3,702** | **3,723** | **3,808** | **3,713** | **3,737** | **46.5** | **45.5** |
| තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් වාහන හා යතුරු පැදි අලුත්වැඩියා කිරීම | 1,102 | 1,083 | 1,200 | 1,216 | 1,142 | 1,160 | 13.9 | 14.1 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරීම | 516 | 502 | 515 | 530 | 506 | 513 | 6.5 | 6.3 |
| නවාතැන් හා ආහාර සැපයීම | 203 | 194 | 203 | 248 | 197 | 210 | 2.6 | 2.6 |
| තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කටයුතු | 62 | 70 | 61 | 76 | 74 | 70 | 0.8 | 0.9 |
| මූල්‍ය සහ රක්ෂණ කටයුතු | 159 | 154 | 146 | 177 | 162 | 160 | 2.0 | 1.9 |
| වෘත්තිය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු | 55 | 60 | 60 | 63 | 95 | 70 | 0.7 | 0.8 |
| පරිපාලනමය සහ සහාය සේවා කටයුතු | 107 | 126 | 121 | 151 | 211 | 152 | 1.4 | 1.9 |
| රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය | 609 | 617 | 578 | 535 | 377 | 527 | 7.7 | 6.4 |
| අධ්‍යාපනය | 344 | 380 | 345 | 368 | 416 | 377 | 4.3 | 4.6 |
| මහජන සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 142 | 146 | 155 | 136 | 161 | 149 | 1.8 | 1.8 |
| වෙනත් (ඉ) | 397 | 371 | 339 | 309 | 371 | 348 | 5.0 | 4.2 |
| **මුළු සේවා නියුක්තිය** | **7,948** | **8,230** | **8,139** | **8,164** | **8,300** | **8,208** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 95.6 | 95.9 | 95.5 | 95.8 | 96.0 | 95.8 | | |

(අ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ආ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඈ) තාවකාලික
(ඉ) නිවැසියන්ගේ පරිහරණය සඳහා සම්පාදනය කරනු ලබන සේවා යෝජක කටයුතු, දේපල වෙළඳාම් කටයුතු, කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ ජාත්‍යන්තර සංවිධාන කටයුතු ඇතුළත් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනිත වූ බවත් ව්‍යවසායකත්වය ඉහළ ගිය බවත්ය. විශේෂයෙන්ම සේව්‍ය අංශයේ සිදු වූ ඉහළ යෑම ඉදිරි කාලයේ දී වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් සහ වෙනත් ආර්ථික ප්‍රතිලාභ රාශියක් ඇති වීමට හේතු විය හැකිය. අනාරක්ෂිත සේවා නියුක්තිය[10] 2017 වසරේ ගෝලීය සාමාන්‍යය වන සියයට 42 ට[11] ආසන්න අගයක පැවති අතර එය මුළු සේවා නියුක්තියෙන් සියයට 39.3 ක් ලෙස වාර්තා විය. මෙම කාණ්ඩයේ සේවය කරන පුද්ගලයන් කිසිදු කම්කරු රෙගුලාසියක් මගින් පාලනය නොවන අතර යහපත් සේවා තත්ත්වවලට ද බොහෝ විට හිමිකම් නොකියයි.

මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2016 වසරේ වාර්තා වූ 1,389,767 ට සාපේක්ෂව 2017 වසර අවසානයේ දී 1,394,172 විය. මෙම සමීක්ෂණයට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් ඇතුළත් වේ.

## සේවා වියුක්තිය

ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකයේ සිදු වූ සැලකිය යුතු පහළ යෑම හේතු කොටගෙන සමස්ත සේවා වියුක්ති අනුපාතිකය, 2016 වසරේ දී වාර්තා වූ සියයට 4.4 ට සාපේක්ෂව, 2017 වසරේ දී සියයට 4.2 දක්වා පහළ ගියේය. 2017 වසර තුළ දී සමස්ත ශ්‍රම බලකාය හා සේවා නියුක්ති ජනගහනය 2016

10 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අර්ථ දැක්වීමට අනුව අනාරක්ෂිත සේවා නියුක්තිය යනු ස්වයං රැකියාවල නියුතු වූවන් සංඛ්‍යාව සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන්ගේ එකතුවයි.

11 World Employment Social Outlook-Trends 2018, International Labour Organisation.

**4.10 සංඛ්‍යා සටහන**

**රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)**

පුද්ගලයන්

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයන් | පෞද්ගලික අංශයේ සේවකයන් | සේව්‍යයන් | ස්වයං රැකියාවල නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2016 | 1,157,658 | 3,437,919 | 217,215 | 2,511,750 | 623,141 | 7,947,683 |
| **2017 (ඇ)** | **1,178,708** | **3,555,323** | **247,470** | **2,571,023** | **655,655** | **8,208,179** |
| පළමු කාර්තුව | 1,215,187 | 3,572,361 | 258,117 | 2,504,860 | 679,682 | 8,230,207 |
| දෙවන කාර්තුව | 1,162,738 | 3,513,026 | 237,563 | 2,601,122 | 624,280 | 8,138,728 |
| තෙවන කාර්තුව | 1,146,652 | 3,539,312 | 264,456 | 2,513,366 | 700,083 | 8,163,869 |
| සිව්වන කාර්තුව | 1,190,257 | 3,596,593 | 229,743 | 2,664,743 | 618,574 | 8,299,911 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජුලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වසරට සාපේක්ෂව පිළිවෙළින් සියයට 3.1 කින් හා සියයට 3.3 කින් වර්ධනය වීම හේතුවෙන් රැකියා විරහිත පුද්ගලයන් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබිණි. පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 2017 වසරේ දී සියයට 2.9 හි නොවෙනස්ව පැවති අතර ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2016 වසරේ පැවති සියයට 7.0 සිට 2017 වසරේ දී සියයට 6.5 දක්වා පහළ ගියේය.

**සමස්ත සේවා වියුක්ති අනුපාතිකය අඩු අගයක පැවතිය ද තරුණයන්, අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් සහ ස්ත්‍රීන්ගේ සේවා වියුක්තිය තවමත් ඉහළ මට්ටමක පවතී.** අධ්‍යාපන මට්ටම අනුව, අ.පො.ස (උ.පෙළ) සහ ඊට ඉහළ කාණ්ඩය තුළ ඉහළම සේවා වියුක්ති අනුපාතිකය අඛණ්ඩව දැකිය හැකි වූ අතර 2017 වසරේ දී එය සියයට 8.1 ක් විය. තරුණ (වයස අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතිකය 2016 වසරේ වාර්තා වූ සියයට 21.6 ට සාපේක්ෂව 2017 වසරේ දී සියයට 18.6 දක්වා පහත වැටිණි. වයස අවුරුදු 30 ට වැඩි පිරිස අතර සේවා වියුක්තිය අඩු මට්ටමක පැවති අතර ඉහළ සේවා පළපුරුද්ද සහ දිගු කාලීන සේවා නියුක්තිය තුළින් කුසලතා වර්ධනය කරගැනීම හේතුවෙන් රැකියාවක යෙදී සිටීමේ හැකියාව ඉහළ යෑම මෙයට හේතු විය හැකිය. තරුණ හා අධ්‍යාපන සුදුසුකම් සහිත කාණ්ඩ අතර ඉහළ සේවා වියුක්තියක් පැවතීමට හේතු සාධක ලෙස පුහුණු ශ්‍රමයක් අවශ්‍ය රැකියා නිර්මාණය වීම සීමා සහිත වීම සහ ශ්‍රම වෙළඳපොළේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් ශ්‍රම සැපයුමක් නොවීම දැක්විය හැකිය. අධ්‍යාපන පද්ධතිය තුළින් ප්‍රාථමික පාසල්වල සිට විශ්ව විද්‍යාල දක්වාම නිදහස් අධ්‍යාපනය සාධාරණව ලබා දුන්නද, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන, වෘත්තීය හා තාක්ෂණ පුහුණු පද්ධති ආර්ථිකයෙහි විවිධ අංශවල ඉල්ලුමට සරිලන නිපුණතා ජනනය කිරීමේ දී අඩු ප්‍රගතියක් පෙන්වා ඇත. ඒ අනුව, විධිමත් අධ්‍යාපනය, ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවලට අනුකූලව ගැලපීම ඉක්මනින්ම සිදුකළ යුතුය. දේශීය ශ්‍රම වෙළඳපොළට උචිත නිපුණතා ප්‍රමාණවත් පරිදි සැපයීමට පොදු අරමුණු සහිත අධ්‍යාපන සහ පුහුණු පද්ධති/ආයතන මත පනවා ඇති දැඩි විධි විධාන ලිහිල් කළ යුතුය. මීට අමතරව, ශ්‍රම ඉල්ලුම් අංශ හඳුනා ගැනීමට සහ ශ්‍රම සුලභතාව තක්සේරු කිරීමට

**4.11 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2015 | 2016 (අ) | 2017 (ආ) | ප්‍රතිශත වෙනස 2016/ 2015 (අ) | ප්‍රතිශත වෙනස 2017/ 2016 (ආ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ඇ) | 1,136,656 | 1,146,995 | 1,149,867 | 0.9 | 0.3 |
| අර්ධ රාජ්‍ය (ඈ) | 238,474 | 242,772 | 244,305 | 1.8 | 0.6 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,375,130** | **1,389,767** | **1,394,172** | **1.1** | **0.3** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.8 රූප සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (%)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.9 රූප සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (%) - 2017**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රාජ්‍ය සහ පෞද්ගලික අංශ සහයෝගිතාවයෙන් කටයුතු කළ යුතුය. එවැනි වාතාවරණයකදී, ගතානුගතික ඉගැනුම් සහ පුහුණු ක්‍රම අභියෝගයට ලක්වන අතර ආයතන සහ පුහුණුවන්නන් හට වෙනස්වන ස්වභාවයට හැඩගැසීමට සිදුවනු ඇත.

**රැකියා අවස්ථා ජනනය කරන්නන්ගේ අවශ්‍යතා සහ රැකියා අපේක්ෂකයන්ගේ අපේක්ෂා අතර විශාල පරතරයක් නිර්මාණය වී ඇති අතර, එය දේශීය වෙළඳපොළ තුළ ශ්‍රම හිඟයක් ඇති කර ඇත.** ව්‍යාපාර මතය පිළිබඳ සමීක්ෂණවල ප්‍රතිඵලවලින් තහවුරු වන පරිදි ද ශ්‍රමිකයන් බඳවා ගැනීමට ව්‍යාපාරවල ඇති අභිප්‍රාය බොහෝ සෙයින් ධනාත්මක වුවද ශ්‍රම සුලභතාව ඉතා පසුගාමී තත්ත්වයක පැවතුණි. තවද, 2017 වසරේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කරන ලද ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයට අනුව, දීර්ඝ කාලයක් පුරා දක්නට ලැබෙන නිපුණතා පරතරයේ ප්‍රතිඵලයක් ලෙස රට තුළ 2017 වසරේ ජූනි මස පැවති ආසන්න වශයෙන් මිලියන 0.5 ක් වන පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමේ අපහසුතාවයට ප්‍රධාන හේතු ලෙස දක්වා ඇත්තේ ඇතැම් රැකියා සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් නොමැති වීම, වෙනත් සේවා යෝජකයන්ගෙන් එල්ල වන ඉහළ තරඟකාරීත්වය, ඉහළ වැටුප් අපේක්ෂා කිරීම සහ සුදුසුකම්ලත් අයදුම්කරුවන් නොමැති වීමයි. ශ්‍රම හිඟය පිළිබඳ ගැටලුවට නිසි කල දී විසඳුම් ලබා නොදුනහොත් නිපුණතා පරතරයකට සහ ශ්‍රම හිඟ යකට දීර්ඝකාලීනව මුහුණ දී සිටින අංශ විසින් ශ්‍රමය ආනයනය කිරීම සඳහා රජයෙන් අඛණ්ඩව අනුමැතිය ඉල්ලීම සිදු විය හැකිය. ශ්‍රම හිඟය පිළිබඳ ගැටළුව සඳහා ප්‍රතිපත්තිමය පියවර ලෙස, සමාජයීය වශයෙන් පිළිනොගත් ඇතැම් රැකියාවලට රැකියා අපේක්ෂකයන් ආකර්ෂණය කර ගත හැකි පරිදි වෘත්තීය පිළිගැනීමක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය හැකිය. තවද, යල්පැන ගිය කම්කරු නීති සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම, කම්කරු උපදේශන සභාවල තරුණ කාණ්ඩයෙන්ද නියෝජනයක් ඇති කිරීම, පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව ඉල්ලුම මත පදනම් වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පවත්නා ශ්‍රම බලකායේ නිපුණතා වර්ධනය කිරීම හා නැවත හැඩගැස්වීම සහ අධ්‍යාපනය හෝ පූර්ව

**4.12 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (අ)(ආ)**

| කාණ්ඩය | 2016 | 2017 (ඇ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **සමස්ත** | **4.4** | **4.1** | **4.5** | **4.2** | **4.0** | **4.2** |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 2.9 | 2.7 | 3.0 | 2.7 | 3.0 | 2.9 |
| ස්ත්‍රී | 7.0 | 6.5 | 7.1 | 6.8 | 5.6 | 6.5 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | | | | | | |
| 5 ශ්‍රේණිය සමත් සහ ඊට පහළ | ... | ... | ... | ... | ... | ... |
| 6-10 ශ්‍රේණි | 3.3 | 2.9 | 3.5 | 2.4 | 2.3 | 2.8 |
| අ.පො.ස. (සා.පෙ.) | 5.8 | 5.7 | 6.0 | 6.0 | 5.8 | 5.9 |
| අ.පො.ස. (උ.පෙ.) සහ ඊට ඉහළ | 8.3 | 7.8 | 8.2 | 8.5 | 7.9 | 8.1 |
| **වයස් කාණ්ඩ අනුව (අවුරුදු)** | | | | | | |
| 15-19 | 27.1 | 22.1 | 25.6 | 16.1 | 20.6 | 21.1 |
| 20-24 | 19.9 | 17.4 | 18.4 | 19.0 | 16.6 | 17.8 |
| 25-29 | 9.2 | 8.0 | 11.3 | 9.8 | 8.9 | 9.5 |
| 30-39 | 2.4 | 2.9 | 2.5 | 3.2 | 2.2 | 2.7 |
| 40 සහ ඊට ඉහළ | 0.8 | 1.0 | 0.9 | 0.8 | 1.0 | 0.9 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.10 රූප සටහන**

**නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**




මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය

**4.13 සංඛ්‍යා සටහන**
**විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2015 | | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ආයකත්වය % | සංඛ්‍යාව | ආයකත්වය % | සංඛ්‍යාව | ආයකත්වය % |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **263,443** | **100.0** | **242,816** | **100.0** | **212,162** | **100.0** |
| **මූලයන් අනුව** | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 116,749 | 44.3 | 87,982 | 36.2 | 68,564 | 32.3 |
| වෙනත් | 146,694 | 55.7 | 154,834 | 63.8 | 143,598 | 67.7 |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 172,788 | 65.6 | 160,306 | 66.0 | 139,271 | 65.6 |
| ස්ත්‍රී | 90,655 | 34.4 | 82,510 | 34.0 | 72,891 | 34.4 |
| **ශ්‍රම කාණ්ඩය අනුව** | | | | | | |
| වෘත්තීය | 6,251 | 2.4 | 6,578 | 2.7 | 6,371 | 3.0 |
| මධ්‍යම | 6,951 | 2.6 | 8,234 | 3.4 | 7,124 | 3.4 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 12,501 | 4.7 | 10,862 | 4.5 | 9,265 | 4.4 |
| පුහුණු ශ්‍රමික | 81,682 | 31.0 | 76,545 | 31.5 | 68,993 | 32.5 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 4,847 | 1.8 | 3,926 | 1.6 | 3,295 | 1.6 |
| නුපුහුණු ශ්‍රමික | 77,985 | 29.6 | 71,656 | 29.5 | 61,057 | 28.8 |
| ගෘහ සේවිකා | 73,226 | 27.8 | 65,015 | 26.8 | 56,057 | 26.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

පළපුරුද්ද මත වෘත්තීය සහතික කිරීම සඳහා පියවර ගත යුතුය. මානව ප්‍රග්ධනය ශ්‍රී ලංකාව සතු ප්‍රධානතම සාධකයක් ලෙස හඳුනාගෙන ඇති බැවින් ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනය ලඟා කර ගැනීමට ගම්බද තරුණ කණ්ඩායම් ඇතුළුව දේශීය ශ්‍රම බලකායේ උපරිම උපයෝජනය ලබා ගැනීම සඳහා මානව සම්පත තවදුරටත් වැඩිදියුණු කළ යුතුය.

## විදේශ සේවා නියුක්තිය

2017 වසර තුළ දී 2016 වසරට සාපේක්ෂව **විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගේ සියයට 12.6 ක පහළ යෑමක් වාර්තා විය.** 2014 වසරේ සිට දක්නට ලැබෙන විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගේ අඛණ්ඩ පහළ යෑමට හේතුව ලෙස නුපුහුණු ශ්‍රමිකයන්, විශේෂයෙන් ගෘහ සේවිකා අංශය යටතේ විදෙස් ගතවන්නන්, ප්‍රමාණය අවම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සැලකිය හැකිය. විදෙස් රැකියා වෙළඳපොළවල, විශේෂයෙන් මැද පෙරදිග රටවල, පවතින අඩු ඉල්ලුම සහ සංක්‍රමණික ශ්‍රමිකයන් සම්බන්ධ එම රටවල රාජ්‍ය ප්‍රතිපත්ති, විදෙස් රැකියා සඳහා පිටත්ව යන සංඛ්‍යාව පහළ යෑම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇත. ශ්‍රමය සඳහා රට තුළ විවිධ අංශ මගින් ඇති ඉල්ලුම ඉහළ යෑම ද මෙම අඩුවීමට බලපෑ හේතුවක් ලෙස සැලකිය හැකිය. ඒ අනුව, 2016 වර්ෂය තුළ දී වාර්තා වූ 242,816 ක් වූ විදේශ රැකියා සඳහා පිටත්වන්නන් සංඛ්‍යාවට සාපේක්ෂව 2017 වසරේ දී එම සංඛ්‍යාව 212,162 ක් ලෙස වාර්තා විය. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය කාන්තාවන් සංඛ්‍යාව 72,891 ක් දක්වා සියයට 11.7 කින් ද, පුරුෂයන් සංඛ්‍යාව 139,271 දක්වා සියයට 13.1 කින් ද පහළ යන ලදී. විදේශ රැකියා සඳහා පිටත්ව යන සංඛ්‍යාවෙන් සියයට 34 ක් පමණ කාන්තාවන් වන අතර මෙය මීට දශකයකට පෙර පැවති ගෘහ සේවිකාවන් මුල් කරගත් සියයට 53 ක් වූ කාන්තා නියෝජනයට වඩා ඉතා පහළ අගයකි.

**නිපුණතා මට්ටම් අනුව සැලකූ විට, විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන් සංඛ්‍යාව සියලු නිපුණතා මට්ටම් ආශ්‍රිතව අඩු වීමක් පෙන්වීය.** "ආරක්ෂිත, පුහුණු ශ්‍රමික පිටත්ව යෑම්" යන උපායමාර්ගික දිශාව වෙනුවෙන් බලධාරීන් විසින් කලක සිට ක්‍රියාමාර්ග ගෙන තිබුණද, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන් තවදුරටත්, මුළු පිටත්වීම්වලින් සියයට 55 ක් ලෙස වාර්තා විය. එමෙන්ම වෘත්තිමය අංශයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන් සංඛ්‍යාව මුළු පිටත්වීම්වලින් සියයට 3 ක් ද මධ්‍යම මට්ටමේ රැකියා සඳහා යන්නන් සංඛ්‍යාව, මුළු පිටත්වීම්වලින් සියයට 3.4 ක් ද විය. කෙසේ වෙතත්, දැනුම පදනම් කර ගත් ආර්ථික නිර්මාණය කිරීම සඳහා වර්තමානයේ දී අවධානය යොමුකර ඇති ගල්ෆ් කලාපයේ රටවල් ඇතුළු බොහෝ රටවල්වල, වෘත්තිමය හා පුහුණු ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පැවතිය ද 2017 වසරේ දී එම අංශවල රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 2016 වසරට සාපේක්ෂව අඩු විය. රැකියා සඳහා විදේශ ගත වීම්, ලියාපදිංචි නියෝජිත ආයතන හරහා සිදු කිරීමට බලධාරීන් අඛණ්ඩව උත්සාහ

**4.14 සංඛ්‍යා සටහන**

**ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2016 (අ) | | 2017 (ආ) | | වෙනස (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබිය | 63,293 | 26.1 | 37,900 | 17.9 | -25,393 | -40.1 |
| කටාර් | 59,523 | 24.5 | 56,644 | 26.7 | -2,879 | -4.8 |
| කුවේට් | 32,400 | 13.3 | 37,420 | 17.6 | 5,020 | 15.5 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 40,117 | 16.5 | 36,657 | 17.3 | -3,460 | -8.6 |
| වෙනත් | 47,483 | 19.6 | 43,541 | 20.5 | -3,942 | -8.3 |
| **එකතුව** | **242,816** | **100.0** | **212,162** | **100.0** | **-30,654** | **-12.6** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය



ගෙන තිබුණ ද, විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් ආසන්න වශයෙන් සියයට 68 ක ප්‍රතිශතයක් තවදුරටත් වෙනත් පුද්ගලික මූලාශ්‍ර හරහා විදේශ රැකියා සඳහා පිටත්ව යැම සිදු වේ. රැකියා සම්බන්ධ අයිතීන් සහ වෙනත් සමාජීය උවදුරු සම්බන්ධයෙන් අනාරක්ෂිත, අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දෙන විදේශ රැකියාවල නියුතු ශ්‍රමික සමූහයක් බිහිවීමට මෙම තත්ත්වය හේතු විය හැකිය. 2017 වසර තුළ දී ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ට රටවල් 108 ක රැකියා අවස්ථා හිමි වූ අතර එම ශ්‍රමිකයන්ගෙන් සියයට 90 කට පමණ මැද පෙරදිග රටවල්වල රැකියා හිමි වී ඇත. එමගින් රැකියා සඳහා විදේශ ගත වීම් සම්බන්ධයෙන් මැදපෙරදිග රටවල් තවදුරටත් ප්‍රමුඛ ස්ථානයක සිටින බව පෙන්නුම් කෙරේ. 2017 ජූනි මාසයේ දී සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන් සහ ඊජිප්තුව වැනි රටවල් කිහිපයක් කටාර් රාජ්‍යය සමග පැවති රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවලට සීමා පනවන ලද අතර වාර්ෂිකව රැකියා සඳහා විදෙස් ගතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් හතරෙන් එකක් පමණ කටාර් රාජ්‍යයේ රැකියා සඳහා පිටත්ව යයි. ඒ අනුව, කටාර් රාජ්‍යය බලා පිටත්ව යන ශ්‍රමික සංඛ්‍යාව 2016 වසරේ දී වාර්තා වූ 59,523 ට සාපේක්ෂව 2017 වසරේ දී 56,644 දක්වා අඩු විය.

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය විදෙස්ගත සේවකයන්ගේ ප්‍රේෂණ මත විශාල වශයෙන් රඳා පැවතීමේ තත්ත්වය අඩු කිරීම සඳහා ක්‍රියාකළ යුතුය.** තරුණ විරැකියාව ඉහළ යැම වැනි සමාජ ආර්ථිකමය ප්‍රවණතා හේතුවෙන් මැද පෙරදිග රටවල් කිහිපයක් ස්වදේශිකයන්ට රැකියා නිර්මාණය කිරීම සහ සංක්‍රමණික ශ්‍රමය සීමා කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. මෙවැනි තත්ත්ව එම වෙළඳපොළවල රැකියා අවස්ථා ලබා ගැනීමට ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ඇති හැකියාවට සැලකිය යුතු ලෙස බලපායි. ඊට අමතරව, පුහුණු ශ්‍රමිකයන් සඳහා ඇති වැඩි ඉල්ලුම සහ ශ්‍රම පිරිවැය අඩු කිරීම සඳහා තාක්ෂණය මත පදනම් වූ මහා පරිමාණ ආයෝජන සිදු කිරීම හේතුවෙන් ද නුදුරු අනාගතයේ දී ශ්‍රී ලාංකිකයන්ට ලබා ගැනීමට හැකි විදේශ රැකියා අවස්ථා සීමා වනු ඇත. එබැවින්, දැනටමත් ප්‍රවේශය ලබාගෙන ඇති විදෙස් ශ්‍රම වෙළඳපොළවල් ආශ්‍රිත වඩා ඉහළ මට්ටමේ රැකියා ලබා ගැනීමට සහ දැනට ප්‍රවේශයක් නොමැති සංවර්ධිත රටවල් ආශ්‍රිතව ඇති නව ශ්‍රම වෙළඳපොළවල පවතින රැකියා අවස්ථා අත්පත් කරගැනීම සඳහා මෙරට ක්‍රියාත්මක වෘත්තීය පුහුණු පද්ධති අන්තර්ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි හැඩගැස්වීම වැදගත්ය. මේ අතර, නුපුහුණු සහ මධ්‍යම මට්ටමේ විදේශ රැකියා අපේක්ෂකයන් ගෙන් සැලකිය යුතු කොටසක් සාපේක්ෂව ඉහළ වැටුප් සහිත එහෙත් බරපතල ශ්‍රම හිඟයකට මුහුණ දී සිටින දේශීය කර්මාන්ත කෙරෙහි යොමු කිරීමට කටයුතු කළ යුතුය. සමස්තයක් ලෙස සැලකූ විට, විදෙස්ගත සේවක ප්‍රේෂණ මත අධික ලෙස යැපීමේ තත්ත්වය ලිහිල් කිරීම සඳහා අපනයන ධාරිතාව ක්‍රමයෙන් වැඩි දියුණු කිරීම හා සෘජු විදේශ ආයෝජන ඉහළ නැංවීම වැනි දිගු කාලීන පියවර ගත යුතුය.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා විවිධ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරතුර සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා ද කටයුතු යොදන ලදී.** ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන් විශ්වාසවන්ත රැකියා අවස්ථාවල යෙදීම තහවුරු කිරීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2017 වසරේ දී විදේශ රැකියා සඳහා නීති විරෝධී ලෙස පුද්ගලයන් බඳවා ගැනීම් සම්බන්ධ වැටලීම් 224 ක් සිදු කර ඇති අතර එය 2016 වසරේ වාර්තා වූ වැටලීම්වලට සාපේක්ෂව සියයට 27 ක ඉහළ යැමකි. තවද, විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ඇති බලතල අනුව, 2017 වසරේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, නීති විරෝධී ආයතනවලට සහ නීතිය උල්ලංඝනය කළ බලපත්‍රලාභී ආයතනවලට එරෙහිව නඩු 239 ක් පවරන ලදී. සංක්‍රමණික සේවකයන්ගේ ආරක්ෂාව පිළිබඳ සුභ සාධන පියවරක් ලෙස 2017 වසරේ දී සංක්‍රමණික සේවකයන් 212,470 දෙනෙකු ආවරණය වන රක්ෂණ ක්‍රමයක් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් රුපියල් මිලියන 139.2 ක් ගෙවා ඇත. 2017 වසරේ දී, සත්කාරක රටවල දී මුහුණ පෑ විවිධ ගැටලු හේතුවෙන් සංක්‍රමණික සේවකයන් 1,966 ක් ආපසු මෙරටට ගෙන්වා ගැනීමට රක්ෂණ යෝජනා

**4.15 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2014 | 31 | 4,833 | 29,165 | 7 | 1,618 | 8,158 | 38 | 6,451 | 37,323 |
| 2015 | 31 | 10,427 | 70,697 | 20 | 4,488 | 11,597 | 51 | 14,915 | 82,294 |
| **2016 (ආ)** | **26** | **11,185** | **85,637** | **15** | **10,167** | **18,690** | **41** | **21,352** | **104,327** |
| පළමු කාර්තුව | 11 | 3,876 | 26,083 | 2 | 4,350 | 8,700 | 13 | 8,226 | 34,783 |
| දෙවන කාර්තුව | 6 | 2,380 | 14,661 | 8 | 3,022 | 5,775 | 14 | 5,402 | 20,436 |
| තෙවන කාර්තුව | 3 | 533 | 2,877 | 4 | 2,773 | 4,193 | 7 | 3,306 | 7,070 |
| සිව්වන කාර්තුව | 6 | 4,396 | 42,016 | 1 | 22 | 22 | 7 | 4,418 | 42,038 |
| **2017 (ඇ)** | **12** | **1,885** | **5,643** | **20** | **8,427** | **52,636** | **32** | **10,312** | **58,279** |
| පළමු කාර්තුව | 3 | 343 | 1,011 | 9 | 3,344 | 23,258 | 12 | 3,687 | 24,269 |
| දෙවන කාර්තුව | 6 | 767 | 2,632 | 6 | 2,401 | 6,452 | 12 | 3,168 | 9,084 |
| තෙවන කාර්තුව | 1 | 335 | 1,340 | 5 | 2,682 | 22,926 | 6 | 3,017 | 24,266 |
| සිව්වන කාර්තුව | 2 | 440 | 660 | - | - | - | 2 | 440 | 660 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

ක්‍රමය සහ ''සේවක සුභ සාධක අරමුදලින්'' රුපියල් මිලියන 78.8 ක් උපයෝගී කරගෙන ඇත. දිවයින පුරා විහිදුණු විදෙස් ශ්‍රමිකයන් ජාලය වෙනුවෙන් පහසුකම් සැලසීමේ අදහසින්, සංක්‍රමණික ශ්‍රමිකයන් බහුල පළාත්වල සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටු වීමට පියවර ගනිමින් පවතී.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

වැඩ වර්ජන සංඛ්‍යාව, වැඩ වර්ජන සඳහා සහභාගි වූ සමස්ත සේවක සංඛ්‍යාව සහ එම වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පහළ යෑම තුළින් 2017 වසරේ දී පුද්ගලික අංශයේ කම්කරු සබඳතාවල වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඒ අනුව, 2017 වසරේ දී වැඩවර්ජන 32 ක් වාර්තා වූ අතර ඒ සඳහා සහභාගී වූ සමස්ත සේවක සංඛ්‍යාව 10,312 ක් සහ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන 58,279 ක් විය. මේ සඳහා, වැවිලි අංශය හැර අනෙකුත් අංශ ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා වන පුද්ගලික කර්මාන්තවල වැඩ වර්ජන පිළිබඳව පමණක් මෙම දත්ත මගින් පෙන්නුම් කරන අතර එලෙස වාර්තා වූ වැඩ වර්ජනවලට අමතරව, මහජනතාවගේ දෛනික ජීවිතයට සහ සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම්වලට සැලකිය යුතු අයහපත් බලපෑමක් ඇති කළ හැකි මට්ටමේ වැඩ වර්ජන ගණනාවක් (2017 වසරේ දී වර්ජන 16 ක් පමණ) සෞඛ්‍ය, අධ්‍යාපන, ඛණිජ තෙල්, තැපැල් හා ප්‍රවාහන වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව 2017 වසරේ දී ක්‍රියාත්මක වී ඇත.

පුද්ගලික අංශය තුළ වඩා යහපත් සේවා පරිසරයක් ඇති කිරීම උදෙසා සේවා ස්ථාන සහයෝගිතාව හා කාර්මික සමගිය වර්ධනය කිරීමේ අරමුණින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් 2017 වසරේ දී වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය අවසන් කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය 2017 වසරේ සැප්තැම්බර් මස 8 වන දින එළි දැක්වීය. මීට අමතරව, ජාතික කම්කරු උපදේශන සභාවේ මගපෙන්වීම අනුව, පුද්ගලික අංශයේ සේවයේ නියුතු කාන්තාවන් සඳහා තෙවන දරුවා සහ ඊට පසුව සිදුවන දරු උපත්වල දී මාතෘ ප්‍රතිලාභ නොවෙනස්ව ලබා දීමට සහ සතියේ වැඩ කරන මුළු පැය ගණන වැඩ කරන දින පහ තුළ යොදා ගැනීමට අවශ්‍යය පරිපාලනමය ලිහිල් කිරීම ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබීය. තවද, වයස අවුරුදු 16 දක්වා අධ්‍යාපනය අනිවාර්ය කිරීම සම්බන්ධ රජයේ රෙගුලාසිවලට අනුකූල වන පරිදි, සේවා නියුක්තිය සඳහා බලපාන අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ දැමීම සඳහා, අදාළ කම්කරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමට පියවර ගනු ලැබීය. රැකියා ස්ථානවල කාර්මික සහයෝගිතාව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීමට සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ තෝරාගත් ව්‍යාපාර ආයතනවල කළමනාකරුවන්, කාර්යය මණ්ඩලවල ප්‍රධාන සාමාජිකයන් හා සේවකයන් ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පවත්වන ලදී. සමාජ කතිකාව සහ සේවා

4

ස්ථානය තුළ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා දැක්වූ කැපවීම අගය කිරීම වෙනුවෙන් තෝරාගත් ආයතනවලට තිලිණ ලබාදීම ද 2017 වසරේ දී සිදු විය.

## ශ්‍රම ඵලදායිතාව

**වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2017 වසරේ දී සුළු වශයෙන් පහත වැටිණි.** ඒ අනුව, සමස්ත ඵලදායිතාව, 2016 වසරේ පළමු කාර්තු තුන තුළ වාර්තා වූ පැයට රුපියල් 463.56 සිට 2017 වසරේ පළමු කාර්තු තුන තුළ දී පැයට රුපියල් 458.29 ක් දක්වා සියයට 1.14 කින් පහළ ගියේය. ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන සැලකූ විට කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඵලදායිතාව අවම මට්ටමක පවතින අතර එය වැඩ කළ පැයකට රුපියල් 165.77 කි. වර්තමානයේ දී කෘෂිකාර්මාන්ත අංශයේ දායකත්වය මුළු ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7 ක් පමණ වුවද ආසන්න වශයෙන් සියයට 26 ක පමණ සේවක පිරිසක් එම අංශයේ සේවයේ යෙදී සිටිති. මේ අතර, 2017 වසරේ පළමු කාර්තු තුන තුළ දී කර්මාන්ත සහ සේවා අංශවල ඵලදායිතාව පිළිවෙළින් රුපියල් 479.42 සහ රුපියල් 564.62 ලෙස වාර්තා විය.

**මෑත කාලයේ දී දක්නට ලැබුණු රැකියාවල ව්‍යුහාත්මක වෙනස්වීම් මධ්‍යයේ ආර්ථිකයේ සියලු අංශවල ඵලදායිතාව නැංවීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.** කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග ලෙස වාණිජ කෘෂිකාර්මික කටයුතු සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම, ඉහළ ඵලදාවක් සහිත සහ දෙමුහුම් බීජ වර්ග භාවිතය දැක්විය හැක. නව වෙළඳ ගිවිසුම් ස්ථාපිත කිරීම සහ ඇතැම් වෙළඳ පහසුකම් නැවත යථා තත්ත්වයට පත්කිරීමත් සමග තෝරාගත් විශේෂ වෙළඳපොළ සහ අන්තර්ජාතික පාරිභෝගිකයන් ඉලක්ක කර ගත්, අගයක් එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම තුළින් කර්මාන්ත හා සේවා අංශවල එකතු කළ අගය ඉහළ නැංවීම පිළිබඳව අවධානය යොමු කළ හැකිය. කෘෂිකාර්මික අංශයේ අඩු එකතු කළ අගය මෙන්ම, සේවා නියුක්ත මුළු ජනගහනයෙන් වැඩි කොටසක් එම අංශයේ සේවයේ නියුතු වීම කෘෂිකාර්මික අංශයේ අඩු ඵලදායිතාවක් පැවතීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය. ඒ අනුව, කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නිරත වන ග්‍රාමීය තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව තුළින් වඩා ඉහළ එකතු කළ අගයක් ඇති අංශවලට යොමුකිරීමේ හැකියාවක් පවතී. තවද, රටපුරා වෙසෙන ග්‍රාමීය තරුණ තරුණියන් එවැනි පුහුණු වැඩසටහන් සඳහා ආකර්ෂණය කර ගැනීම සඳහා ජාතික මට්ටමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අතර එමගින් තරඟකාරී සහ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් නිර්මාණය කිරීමේ පුළුල් ආර්ථික න්‍යාය පත්‍රය සමග තරුණ ආකල්ප පෙළගැසීම සිදුවනු ඇත.

**4.16 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව (අ)**

| ශීර්ෂය | 2016 (පළමු කාර්තු තුන) (ආ) | 2016 (ආ) | 2017 (පළමු කාර්තු තුන) |
|---|---|---|---|
| ස්ථාවර (2010) මිල අනුව | | | |
| **දළ එකතු කළ අගය (රුපියල් මිලියන)** | **6,026,066** | **8,167,563** | **6,206,968** |
| කෘෂිකර්මාන්ත | 477,747 | 644,262 | 461,010 |
| කර්මාන්ත | 1,785,716 | 2,399,285 | 1,862,046 |
| සේවා | 3,762,602 | 5,124,016 | 3,883,912 |
| ශ්‍රම ඵලදායිතාව, වැඩ කරන ලද | | | |
| **පැයක් සඳහා රුපියල්** | **463.56** | **467.23** | **458.29** |
| කෘෂිකර්මාන්ත | 173.19 | 172.28 | 165.77 |
| කර්මාන්ත | 501.93 | 504.55 | 479.42 |
| සේවා | 562.98 | 570.23 | 564.62 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4